**ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය සහ එහි පරිපාලිතයන් - 2022**

**-------------------------------------------------------------**

# 1. මූල්‍ය ප්‍රකාශන

## 1.1 අහිතකර මතය

ශ්‍රී ලංකා මහවැලි අධිකාරියේ සහ එහි පරිපාලිතයන්ගේ ("අධිකාරිය") 2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ සාකච්ඡා කර ඇති කරුණුවල වැදගත් බව හේතුවෙන් අධිකාරියේ සහ සමූහයේ මූල්‍ය ප්‍රකාශන තුළින් 2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා ඒවායේ මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු නොකරන බව මා දරන්නා වූ මතය වේ.

## 1.2 අහිතකර මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව අධිකාරියේ සහ පරිපාලිතයන්ගේ මූල්‍ය ප්‍රකාශන තුළින් සත්‍ය හා සාධාරණ තත්ත්වයන් පිළිඹිබු නොකරන බව මා දරන්නා වූ මතය වේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ අහිතකර මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, අධිකාරිය අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය අධිකාරිය ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා අධිකාරියේ සහ පරිපාලිතයන්ගේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.
අධිකාරියේ සහ පරිපාලිතයන්ගේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරීක්ෂා කිරීමේ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.
2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව අධිකාරියේ සහ පරිපාලිතයන්ගේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 විගණන විෂය පථය (මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම)

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාචෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද අවස්ථාචෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් අධිකාරියේ සහ පරිපාලිතයන්ගේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාළත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම්වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ අධිකාරියේ සහ පරිපාලිතයන්ගේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ අධිකාරියේ සහ පරිපාලිතයන්ගේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, අධිකාරිය ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව,

**1.5 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ**

**1.5.1 ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූල නොවීම**

| | අදාළ ප්‍රමිතියට යොමුව සහිතව අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | අධිකාරිය යටතේ ඉදිකරනු ලැබූ හා වර්තමානය වනවිට අධිකාරිය විසින් පරිපාලනය, ක්‍රියාකරවීම, නඩත්තුව හා වැඩිදියුණු කිරීම් සිදුකරනු ලබන ප්‍රධාන වේලි 11 ක පිරිවැය රු.බිලියන 37.31 ක් ලෙස මූල්‍ය ප්‍රකාශන සටහන් මගින් අනාවරණය කර තිබුණද, ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති අංක 7 හි 19 ඡේදය ප්‍රකාරව ඒවායේ වටිනාකම තක්සේරු කර මූල්‍ය ප්‍රකාශනවල දැක්වීමට කටයුතු කර නොතිබුණි. තවද අධිකාරිය විසින් එම වත්කම්වල මෙහෙයුම් හා නඩත්තු වියදම් දරනු ලැබූවද, ඒ අතුරෙන් ප්‍රාග්ධනිත කළයුතු වියදම් හඳුනාගෙන නිසි පරිදි ගිණුම්ගත කිරීමට කටයුතු කර නොතිබුණි. | 2023 වර්ෂයේදී අධිකාරිය විසින් පරිපාලනය, ක්‍රියාකරවීම, නඩත්තුව හා වැඩි දියුණු කිරීම් සිදු කරනු ලබන ප්‍රධාන වේලි 11 තක්සේරු කිරීම සඳහා එම වේලිවල නෛතික අයිතිය කා වෙත කෙසේ පැවරී ඇත්ද යන්න පිළිබඳව නිශ්චිතතාවයකට පැමිණ නොතිබීම මත ඒ සම්බන්ධයෙන් ලංකා විදුලිබල මණ්ඩලය සමඟ දැනට පවතින ලිපි ලේඛන ආශ්‍රයෙන් මේ වනවිට සාකච්ඡා කර ගෙන යන අතර එහිදී නිශ්චිතවම අධිකාරියේ අයිතිය තහවුරු කර ගෙන විධිමත්ව තක්සේරු කර ගිණුම් ගත කිරීමට කටයුතු කරමි. | ප්‍රමිතිය ප්‍රකාරව වේලි, ඇලවල්, ජලපවහන ක්‍රම, වෙනත් වාරි කර්මාන්ත හා ව්‍යූහ මූල්‍ය ප්‍රකාශනවල දැක්වීමට, වාර්ෂිකව දරනු ලැබූ ප්‍රාග්ධනිත කළයුතු වියදම් ප්‍රාග්ධනිත කිරීමට කටයුතු කළයුතුය. |
| (ආ) | අධිකාරියේ කලාප හා අංශ 18 සඳහා වෙන වෙනම පිළියෙල කර ඉදිරිපත් කර තිබුණු මූල්‍ය ප්‍රකාශනවල ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති 1 හි 118 ඡේදය ප්‍රකාරව ඉදිරිපත් කළයුතු ශුද්ධ වත්කම් වෙනස්වීමේ ප්‍රකාශන හා 127 ඡේදය ප්‍රකාරව ඉදිරිපත් කළයුතු ගිණුම්කරණ ප්‍රතිපත්ති හා අනෙකුත් හෙළිදරව් කිරීම් ඇතුළත් සටහන් ඉදිරිපත් කර නොතිබුණි. තවද, කලාප 11 ක් විසින් ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති 2 හි 1 ඡේදය ප්‍රකාරව ඉදිරිපත් කළයුතු මුදල් ප්‍රවාහ ප්‍රකාශන ඉදිරිපත් කර නොතිබුණි. | අධිකාරිය ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශනය පිළියෙල කිරීමේදී ප්‍රධාන කාර්යාලය ඇතුළු කලාප සහ අංශවල මූල්‍ය ප්‍රකාශන උපයෝගී කරගෙන ඒ මත පදනම්ව ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශනය පිළියෙල කරයි.<br>ප්‍රධාන කාර්යාලය ඇතුළු කලාප හා අංශ වල මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සඳහා අවශ්‍ය උපදෙස්, ගිණුම්කරණ ප්‍රතිපත්ති හා පදනම්, අධිකාරිය පොදුවේ තීරණය කර ඇති අතර, ප්‍රධාන කාර්යාලය ඇතුළු එක් එක් කලාප හා අංශ සඳහා වෙන වෙනම තීරණ ගනු නොලැබේ. එසේම සියළුම වත්කම් හා වගකීම්වල | අධිකාරියේ සියලු කලාප හා අංශ විසින් ගිණුම්කරණ ප්‍රමිති ප්‍රකාරව ඉදිරිපත් කළයුතු ශුද්ධ වත්කම් වෙනස්වීමේ ප්‍රකාශන, ගිණුම්කරණ ප්‍රතිපත්ති හා අනෙකුත් හෙළිදරව් කිරීම් ඇතුළත් සටහන් සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශන ඉදිරිපත් කළයුතුය. |

| | | |
|---|---|---|
| | භාරකාරත්වයක් අධිකාරිය නමින් පවතී. ඒ අනුව ප්‍රධාන කාර්යාලය ඇතුළු සියළුම කලාප හා අංශ සඳහා “ හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශය”ද ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශනයෙහි ඇතුළත් දත්ත තුළින් පමණක් ඉදිරිපත් කර ඇත. එසේම කලාප හා අංශ සඳහා වෙන වෙනම අරමුදල් ලබා දීම හා අංශය/ කලාපය සතු සම්පත් උපයෝජනය තුළින් ආදායම් ඉපැයීම තුළින් අරමුදල් රැස්කරන බැවින් කලාප/ අංශ සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශන වෙන් වෙන් වශයෙන් පිළියෙල කළයුතු බව පිළිගනිමි. ඒ අනුව 2023 වර්ෂයේ සිට එම ආකෘතිය පදනම්ව මුදල් ප්‍රවාහ ප්‍රකාශය ඉදිරිපත් කිරීමට කටයුතු කරමි. | |
| (ඇ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති 1 හි 53 ඡේදය ප්‍රකාරව මූල්‍ය ප්‍රකාශනවල වාර්තා කෙරෙන සියලුම සංඛ්‍යාත්මක තොරතුරු සඳහා පසුගිය වසරේ සංසන්දනාත්මක තොරතුරු හෙළිදරව් කළයුතු වුවද අධිකාරිය විසින් ඒකාබද්ධ මුදල් ප්‍රවාහ ප්‍රකාශය සඳහා සංසන්දනාත්මක තොරතුරු හෙළිදරව් කර නොතිබුණි. තවද සමූහයේ මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ සංසන්දනාත්මක තොරතුරු දැක්වීමේදී ඉකුත් වර්ෂ විගණිත ශේෂ ඉදිරිපත් කර නොතිබූ අතර, නැවත ප්‍රකාශිත ශේෂ පමණක් ඉදිරිපත් කර තිබුණි. | පිළිගනිමි. 2023 වර්ෂයේ සිට ඒකාබද්ධ මුදල් ප්‍රවාහ ප්‍රකාශය සඳහා සංසන්දනාත්මක තොරතුරු හෙළිදරව් කිරීමට කටයුතු කරමි. | ගිණුම්කරණ ප්‍රමිති ප්‍රකාරව මූල්‍ය ප්‍රකාශනවල ඉදිරිපත් කරනු ලබන සියලුම සංඛ්‍යාත්මක තොරතුරු සඳහා සංසන්දනාත්-මක තොරතුරු ඉදිරිපත් කළයුතුය. |
| (ඈ) දේපල පිරියත හා උපකරණ සම්බන්ධයෙන් පහත නිරීක්ෂණයන් කෙරේ. | | |
| (i) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති 7 හි 22 ඡේදය ප්‍රකාරව එකතු කිරීම් හා වැඩි දියුණු කිරීම් සම්බන්ධ ප්‍රාග්ධන වියදම් අදාළ වත්කම් ගිණුමට හර කළයුතු වුවත් කලාප 8 කට | 2023 වර්ෂයේ නිවැරදි කිරීමට හා ප්‍රාග්ධනිත කිරීමට සටහන් කර ගෙන ඇත. | ගිණුම්කරණ ප්‍රමිති ප්‍රකාරව ස්ථාවර වත්කම්වලට අදාළ එකතු කිරීම් හා වැඩි දියුණු කිරීම් ප්‍රාග්ධනිත කළයුතුය. |

| | | | |
|---|---|---|---|
| | අදාළව රු.92,774,812 ක වටිනාකමකින් යුත් ප්‍රාග්ධන ස්වරූපයේ වියදම් අයභාර වියදම් ලෙස ගිණුම්වල දක්වා තිබුණි. | | |
| (ii) | අධිකාරියේ කලාප කාර්යාල, අංශයන්, නිල නිවාස සහ සංචාරක බංගලා ආදිය පිහිටි ඉඩම් හඳුනාගෙන ඒවායේ වටිනාකම හා අධිකාරිය විසින් 1984-1989 කාලයේදී මිලදීගෙන තිබුණු පිරිවැය රු.64,320,853 ක් වූ ඉඩම් කට්ටි 2 ක් දේපල පිරියත හා උපකරණ යටතේ ගිණුම්ගත කර නොතිබුණි. | කොළඹ 10, ටී.බී.ජයා මාවතේ අංක 493 සහ 493/01 යන ඉඩම්වල තක්සේරුව 2023 පෙබරවාරි 01 දින ලැබී ඇති බැවින් 2023 වර්ෂයේ ගිණුම්ගත කිරීමට කටයුතු කරමි.<br>කොළඹ 10, ටී.බී.ජයා මාවතේ, අංක 500 දරන ඉඩමේ තක්සේරුව, තක්සේරු දෙපාර්තමේන්තුව වෙතින් ලබාගෙන ගිණුම්ගත කිරීමට කටයුතු කරමි. කලාප කාර්යාලවල ඉඩම් මැනුම් කටයුතු ආරම්භ කර ඇත. තක්සේරු කිරීමට වසර කිහිපයක් ගතවන බැවින් තක්සේරු කරන පිළිවෙලට ගිණුම්ගත කිරීමට කටයුතු කරමි. | අධිකාරියේ කාර්යාල හා අනිකුත් ගොඩනැගිලි ඉදිකර ඇති ඉඩම් හා මිලදී ගත් ඉඩම් අගයකර මූල්‍ය ප්‍රකාශනවලට ඇතුලත් කිරීමට කටයුතු කළයුතුය. |
| (iii) | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති 7 හි 49 ඡේදය ප්‍රකාරව දේපල හා පිරියත උපකරණ අයිතමයක් ප්‍රත්‍යාගණනය කරන විටෙක එම වත්කම් පංතිය මුළුමනින්ම ප්‍රත්‍යාගණනය කළයුතු වුවත්, සී කලාප නේවාසික ව්‍යාපාර කළමනාකරණ කාර්යාලයේ සම්පූර්ණ පිරිවැය රු.15,601,129 ක් වූ කාර්යාල උපකරණවලින් 2022 ජනවාරි 01 දිනට ප්‍රත්‍යාගණනයට ලක්කර තිබුණේ රු.11,725,422 ක් පිරිවැය වූ කාර්යාල උපකරණ පමණි. ඒ අනුව පිරිවැය රු.3,875,707 ක් වූ අදාළ වත්කම්වලින් සියයට 25 ක් ප්‍රත්‍යාගණනයට ලක් කර නොතිබුණි. වලව නේවාසික ව්‍යාපාර කළමනාකරණ කාර්යාලයේ 2021 ජනවාරි 01 දිනට | 2023 වර්ෂයේදී ගිණුම්ගත කිරීමට කටයුතු කරනු ඇත. | ගිණුම්කරණ ප්‍රමිති ප්‍රකාර වත්කම් ප්‍රත්‍යාගණනයේදී අදාළ වත්කම් පංතිය සම්පූර්ණයෙන් ප්‍රත්‍යාගණනයට කටයුතු කළයුතුය. |

| | | | |
|---|---|---|---|
| | පිරිවැය (සාමාන්‍ය) රු.15,655,004 ක් වූ යන්ත්‍ර සූත්‍රවලින් ප්‍රත්‍යාගණනය කර තිබුණේ රු.10,561,272 ක් පිරිවැය වූ යන්ත්‍ර පමණි. ඒ අනුව අදාළ වත්කම්වලින් සියයට 33 ක් එනම් රු.5,093,735 ක පිරිවැය වූ වත්කම් ප්‍රත්‍යාගණනය කර නොතිබුණි. | | |
| (ඉ) | ප්‍රධාන කාර්යාලය හා කලාප කාර්යාල 7 කට අදාළ නඩු 366 ක් සම්බන්ධයෙන් ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත අංක 8 හි 100 ඡේදය ප්‍රකාර මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කර නොතිබුණි. අධිකාරියට එරෙහි නඩු 23 ක් සඳහා අසම්භාව්‍ය බැරකම් ලෙස රු.56,696,667 ක් හඳුනාගෙන එම අගය ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කර තිබූ නමුත්, ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති අංක 8 හි 22 ඡේදය අනුව අවශ්‍ය පරිදි ප්‍රතිපාදනයන් හඳුනාගැනීමට කටයුතු කර නොතිබුණි. | 2023 වර්ෂයේ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත අංක 8 හා 22 ඡේදය අනුව කටයුතු කිරීමට හා 2023 වර්ෂයේ අසම්භාව්‍ය බැරකම් පිළිබඳ සංක්ෂිප්ත විස්තරයක් මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කිරීමට කටයුතු කරමි. | ගිණුම්කරණ ප්‍රමිතිය ප්‍රකාරව ප්‍රතිපාදනය කළයුතු අසම්භාව්‍ය බැරකම්වලට අදාළව වෙන් කිරීම් සිදු කළයුතු අතර, අනෙකුත් බැරකම්වලට අදාළව මූල්‍ය ප්‍රකාශනවල අවශ්‍ය හෙළිදරව් කිරීම් කළයුතුය. |

### 1.5.2 ගිණුම්කරණ ප්‍රතිපත්ති

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| මහවැලි ඒකාබද්ධ ව්‍යාපෘතිය, නේවාසික ව්‍යාපාර කළමනාකරණ කාර්යාලය - බී කලාපය යටතට පත් කිරීම 2021 මාර්තු 16 දින සිදුකර තිබුණු අතර, ඒ යටතේ මහවැලි ඒකාබද්ධ ව්‍යාපෘතියේ එකතුව රු.121,050,992 ක වත්කම් හා රු.121,050,992 ක වගකීම් පවරාගෙන තිබුණි. 2022 ජනවාරි 01 දින ශේෂයට ඊට අදාළ ගැලපීම් සිදුකර තිබුණද, ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති අංක 1 හි 135 ඡේදය ප්‍රකාරව ඊට අදාළ ගිණුම්කරණ ප්‍රතිපත්තිය හෙළිදරව් කර නොතිබුණි. | ඊට අදාළ ගැලපීම් සිදුකිරීමේ ගිණුම්කරණ ප්‍රතිපත්තිය ඉදිරිපත් කර ඇත. | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති අංක 01 ට අනුව ඒකාබද්ධ කිරීමට අදාළ ප්‍රතිපත්ති හෙළිදරව් කළයුතුය. |

### 1.5.3 ගිණුම්කරණ අඩුපාඩු

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | විගණනයට ඉදිරිපත් කළ තොරතුරු අනුව වේලි ආරක්ෂණ හා ජල සම්පත් සැලසුම්කරණ ව්‍යාපෘතියෙන් රු.671,503,748 ක, මොරගහකන්ද ව්‍යාපෘතියෙන් රු.536,539,275 ක,(වේල්ලේ වටිනාකම හැර) දේශගුණික අවබලපෑම් අවම කිරීමේ ව්‍යාපෘතියෙන් රු.325,457,540 ක වත්කම් අධිකාරිය වෙත ලැබී තිබුණ ද එම වත්කම්වලින් සමාලෝචිත වර්ෂය වනවිට පිළිවෙලින් රු.589,325,677 ක, රු.466,896,356 ක හා රු.78,348,847 ක වත්කම් පමණක් ගිණුම්ගතකර තිබුණි. ඒ අනුව එකතුව රු.398,929,683 ක් වූ වත්කම් ගිණුම්ගත කර නොතිබුණි. | වේලි ආරක්ෂණ හා ජල සම්පත් සැලසුම්කරණ ව්‍යාපෘතියෙන් ලැබී තිබූ වත්කම්වලින් 2022 දෙසැම්බර් 31 දින වන විට ප්‍රත්‍යාගණනය කිරීමට පැවතියේ රු.මිලියන 5 ක වත්කම් පමණි. ඉන් රු.මිලියන 4 ක වත්කම් 2023 වර්ෂයේ මේ වන විට හඳුනාගෙන ප්‍රත්‍යාගණනය කර ගිණුම්වලට ගලපා ඇති අතර ඉතිරි රු. මිලියන 1 ක වත්කම් හඳුනාගෙන ප්‍රත්‍යාගණනය කර 2023 වර්ෂයේ ගිණුම්වල ගැලපීමට කටයුතු කරමි.<br>මොරගහකන්ද ව්‍යාපෘතියෙන් ලැබුණු වත්කම්වලින් රු. මිලියන 459.6 ක වත්කම් අධිකාරිය වෙත මේ වනවිට පවරා ඇති අතර එය ගිණුම් ගත කර ඇත. මෙම ව්‍යාපෘතියේ කාලය තවදුරටත් දීර්ඝ කර ඇති බැවින් ස්ථාවර වත්කම් පැවරීම හා නිරවුල් කිරීමේ කටයුතු තවදුරටත් සිදු වෙමින් පවතී. එම කටයුතු අවසන් වූ විට ව්‍යාපෘතියෙන් ලැබුණු ස්ථාවර වත්කම් ගිණුම් ගතකර අවසන් කළ හැක.<br>දේශගුණික අවබලපෑම් අවම කිරීමේ ව්‍යාපෘතිය මඟින් ලබා දී ඇති වත්කම් වලින් ගිණුම් ගත නොකරන රු. මිලියන 102.2 ක වත්කම් විධිමත් පරිදි හඳුනාගෙන ඇත. එය 2023 වර්ෂයේදී ගිණුම්ගත කරමි. ඉතිරි වත්කම්ද පරීක්ෂා කර බලා හඳුනා ගැනීමෙන් පසු ඉදිරියේදී ගිණුම්ගත කිරීමට කටයුතු කරමි. | ව්‍යාපෘතිවලින් ලැබෙන වත්කම් හඳුනා ගෙන අගය කර ගිණුම්ගත කිරීමට කටයුතු කළයුතුය. |
| (ආ) | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති අංක 13 හි 20 ඡේදය අනුව ආයෝජන දේපල ලෙස හඳුනා ගතයුතු අධිකාරිය සතු බදු කුලී ඉපයීම සඳහා බැහැර කරන ලද ඉඩම් හෙක්ටයාර 6534 ක් අගය කර, ප්‍රමිතියේ 27 ඡේදය ප්‍රකාරව ගිණුම්ගත කර නොතිබුණි. | ආයෝජන දේපල ලෙස බැහැර කර ඇති ඉඩම් සඳහා අදාල තක්සේරු වටිනාකම් පදනම් කර ගෙන ගිණුම්ගත කරන ලෙස සියළුම නේවාසික ව්‍යාපාර කළමණාකරුවන් වෙත දැනටමත් උපදෙස් දී ඇත. ඒ | ආයෝජන කටයුතු සඳහා බැහැර කරන ලද ඉඩම් හඳුනාගෙන ගිණුම්කරණ ප්‍රමිතිය ප්‍රකාරව ගිණුම්ගත කිරීමට කටයුතු කළයුතුය. |

| | | | |
|---|---|---|---|
| | | අනුව 2023 වර්ෂයේ දී ගිණුම් ගත කිරීමට කටයුතු කරමි. | |
| (ඇ) | පශ්චාත් සේවක ප්‍රතිලාභ සැලසුම් යටතේ නිර්වචිත ප්‍රතිලාභ ගෙවීමට අදාළ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති අංක 19 හි 63 ඡේදයට පටහැනිව සේවා කාලය වර්ෂ 5 නොඉක්මවූ සේවකයන්ට අදාළව පාරිතෝෂික සඳහා වෙන් කිරීම් සිදුකර නොතිබුණි. ඒ අනුව සේවා කාලය අවුරුදු 1 සිට 5 දක්වා වූ මහවැලි ආරක්ෂක බලකායට අයත් සේවකයින් 103 දෙනෙකු සඳහා වෙන් කළයුතු රු.6,338,112 ක් අඩුවෙන් පාරිතෝෂික සඳහා වෙන් කර තිබූ අතර, ඒ හේතුවෙන් අලාභය එම ප්‍රමාණයෙන් අඩුවෙන් දක්වා තිබුණි. | පිළිගනිමි. 2023 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන සටහන මඟින් නිවැරදි කිරීමට කටයුතු කර ඇත. | සේවා කාලය වර්ෂ 5 නොඉක්ම වූ සේවකයන් වෙනුවෙන්ද පාරිතෝෂික වෙන් කිරීමට කටයුතු කළයුතුය. |
| (ඈ) | 2019 දෙසැම්බර් 31 දිනට ප්‍රත්‍යාගණිත වටිනාකම රු.34,750,000 ක් වූ වාහන 4 ක් රු.41,794,209 ක් ලෙස රු.7,044,209 ක් වැඩියෙන් දැක්වීම හේතුවෙන් සමාලෝචිත වර්ෂය අවසානයේ එම වත්කම්වල ලියාහල වටිනාකම රු.2,829,138 ක් හා සමුච්චිත ක්ෂයවීම් රු.4,215,171 ක් වැඩියෙන් දක්වා තිබුණි. සමාලෝචිත වර්ෂයේ අදාළ ක්ෂයවීම් රු.1,408,862 ක් වැඩියෙන් දැක්වීම හේතුවෙන් වර්ෂයේ අලාභයද එම ප්‍රමාණයෙන් වැඩියෙන් දක්වා තිබුණි. | අංක PF–7750 වාහනය ස්ථාවර වත්කම් ලේඛනයේ PG-7750 ලෙස වැරදීමකින් ඇතුළත්ව ඇති අතර එය නිවැරදි කර ඇත.<br>වාහන දෙකක් බැගින් මොරගහකන්ද ව්‍යාපෘතියෙන් හා දේශගුණික අවබලපෑම් අවම කිරීමේ ව්‍යාපෘතියෙන් ලැබී ඇත. එම වාහන 2019 වර්ෂය වන විට ද භෞතිකව මහවැලි අධිකාරිය වෙත ලබා දී තිබුණද, විධිමත් ලේඛන මඟින් වර්ෂයකට පමණ පසුව අධිකාරිය වෙත පවරා ඇති අතර එම අවස්ථාවේ ව්‍යාපෘති විසින් ලබා දෙන ලද ලේඛණවල සඳහන් වටිනාකම් පදනම් කර ගෙන එම වාහන ගිණුම් ගත කර ඇත.<br>එබැවින් දැනට ගිණුම් ගත කර ඇති වටිනාකම්, නිවැරදි කර 2023 ජූලි 05 දින නිවැරදි වටිනාකම සහ ක්ෂය වීම් වටිනාකම ජ'නල් අංක 12 මඟින් නිවැරදි කර ඇත. | ප්‍රත්‍යාගණිත වටිනාකම් හා ක්ෂය කිරීම් නිවැරදිව ගිණුම්වලට ගැලපීමට කටයුතු කළයුතුය. |
| (ඉ) | අධිකාරියේ ක්ෂය ප්‍රතිපත්තිය අනුව ගොඩනැගිලි වටිනාකමින් සියයට 2.5 ක් වාර්ෂිකව ක්ෂය කළයුතු වුවත්, ප්‍රධාන කාර්යාලයට අයත් පිරිවැය රු.619,112,600 ක් වූ ගොඩනැගිලි | පිළිගනිමි. 2023 වර්ෂයේ ජර්නල් සටහනක් මඟින් නිවැරදි කිරීමට කටයුතු කර ඇත. | ක්ෂය ප්‍රතිපත්තිය අනුව නිවැරදිව ක්ෂයවීම් ගිණුම්ගත කිරීමට කටයුතු කළයුතුය. |

| | | | |
|---|---|---|---|
| | සියයට 5 බැගින් ක්ෂය කර තිබුණි. ඒ හේතුවෙන් රු.15,477,815 ක් වියයුතු ක්ෂය වටිනාකම රු.30,955,629 ක් ලෙස රු.15,477,815 කින් වැඩියෙන් දක්වා තිබුණු අතර, වර්ෂයේ අලාභයද එම ප්‍රමාණයෙන් වැඩියෙන් දක්වා තිබුණි. සියයට 15 ක ක්ෂය අනුපාතයක් අදාළව පවතින, යන්ත්‍ර පිරියත යටතේ දැක්විය යුතු අයිතම 14 ක් සියයට 20 ක ක්ෂය අනුපාතයක් අදාළ වන වාහන යටතේ දැක්වීම හේතුවෙන් එකතුව රු.3,249,977ක ක්ෂය වැඩියෙන් දක්වා තිබුණු අතර සමාලෝචිත වර්ෂයේ අලාභයද රු.3,249,977 කින් වැඩියෙන් දක්වා තිබුණි. | | |
| (ඊ) | ප්‍රධාන කාර්යාලයීය මූල්‍ය ප්‍රකාශනවල ජංගම ගිණුම් ශේෂ යටතේ 3001 අරමුදල් ගිණුම තුළ දැක්වෙන වසර ගණනාවක් තිස්සේ පැවත එන එකතුව රු.554,135,228 ක් වූ හර ශේෂ හා එකතුව රු.509,098,933ක් වූ බැර ශේෂ පැවතියද ඒවා තහවුරු කරගෙන අවශ්‍ය ගිණුම්කරණ ගැලපීම් සිදුකිරීමට කටයුතු කර නොතිබුණි. | සෑම වසරකම ආරම්භයේදී හර ශේෂ හා බැර ශේෂ ඊට පෙර වර්ෂයේ අවසාන ජංගම ගිණුම් ශේෂ සමඟ ගැලපීම් සිදු කරනු ලැබේ | අරමුදල් ලෙස දක්වා ඇති හර හා බැර ශේෂ නිරවුල් කිරීමට කටයුතු කළයුතුය. |
| (උ) | අමප/19/2770/104/083 අංක දරන 2019 ඔක්තෝබර් 30 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණය අනුව අධිකාරිය සතුව සියයට 99 ක කොටස් හිමිකම පවතින මහවැලි කන්සල්ටන්සි බියුරෝ (පුද්ගලික) සමාගම කෘෂිකර්ම, ග්‍රාමීය, ආර්ථික කටයුතු, වාරිමාර්ග ධීවර හා ජලජ සම්පත් සංවර්ධන අමාත්‍යාංශයට 2020 දෙසැම්බර් 31 දින පවරා තිබුණි. එසේ වුවද මීට අදාළ රු.63,850 ක් වූ කොටස් 6385 ක ආයෝජනය 2022 දෙසැම්බර් 31 දිනට ශ්‍රී ලංකා මහවැලි අධිකාරියේ මූල්‍ය ප්‍රකාශනවල තවදුරටත් දක්වා තිබූ අතර, එම ආයෝජන පැවරීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතියක් ලබාගෙනද නොතිබුණි. | ආයෝජන පැවරීමට අදාළ කටයුතු විධිමත්ව සිදු කිරීමට සටහන් කර ගන්නා ලදී. | මෙම කොටස් පැවරීමට අදාළව මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කිරීම් කළයුතු අතර, ඊට අදාළව ගිණුම්කරණ ගැලපීම් සිදු කළයුතුය. |

### 1.5.4 අධිකාරී බලය නොලත් ගනුදෙනු

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| දිගන නේවාසික ව්‍යාපාර කළමනාකරණ කාර්යාලයට අදාළ හිඟ බදු ආදායම් රු.46,478,749 ක් පෙර වර්ෂ ගැලපුම් ගිණුම හරහා සහ සී කලාපයේ හිඟ බදු ආදායම් රු.29,740,601 ක් ඉඩම් පරිහරණ ගාස්තු ආදායම් ගිණුමට හර කිරීමෙන් අනුමැතියකින් තොරව කපාහැර තිබුණි. | ඉඩම් කොමසාරිස් දෙපාර්තමේන්තුවේ 2020 මැයි 20 දිනැති චක්‍රලේඛ අංක 2020/6 මගින් ලබා දී තිබූ උපදෙස් පාදක කර ගනිමින් හිඟ බදු මුදල් ලෙස රු.46,478,749 ක මුදල කපා හරින ලද බව දන්වමි.<br>අනුමැතියකින් තොරව හිඟ බදු හා ඉඩම් පරිහරණ ගාස්තු, ආදායමින් කපා හැරිමක් සිදුවී නොමැති අතර ගිණුම්කරණ දෝෂයක් නිවැරදි කිරිමක් සිදු කර ඇති බව දන්වමි. ඒ පිළිබඳ විධිමත්ව තොරතුරු ඉදිරිපත් කරන තෙක් ජර්නල් සටහනක් මගින් නිවැරදි කර ඇත. | ලැබිය යුතු ආදායම් අයකර ගැනීමට ගතයුතු සෑම පියවරක්ම ගතයුතුය. කපා හැරීම් සඳහා අවශ්‍ය පරිදි අධිකාරි බලය ලබාගත යුතුය. |

### 1.5.5 අනුචිත ඇගයීම් හෝ ඇස්තමේන්තු කිරීම

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති අංක 11 හි 49 ඡේදය අනුව ප්‍රාග්ධන හා අයහාර ප්‍රදාන සහ වත්කම් ප්‍රදාන ලැබූ වහාම අයහාර ලෙස හඳුනාගත යුතු වුවත් ඒ අනුව කටයුතු නොකිරීම හේතුවෙන් අධිකාරියට විදේශ ව්‍යාපෘති 03 කින් ලැබුණු වත්කම්වලට අදාළ හුවමාරු නොවන ගනුදෙනු වටිනාකම ජීව කාලය අනුව විලම්භනය කර, 2022 දෙසැම්බර් 31 දිනට විලම්භනය කරන ලද ආදායම රු.83,565,000 ක් සහ තවදුරටත් අයහාර ලෙස හඳුනාගතයුතු රු.39,095,160,211 ක් ගෙවිය යුතු ශේෂ යටතේ දක්වා තිබුණි. මීට අමතරව මහා භාණ්ඩාගාරයෙන් අධිකාරියට ලැබුණු ප්‍රාග්ධන ප්‍රදානවලට අදාළව රු.3,204,892,000 ක් වූ සමාලෝචිත වර්ෂයේ විලම්භනය කරන ලද ආදායම හා තව දුරටත් ආදායම් ලෙස හඳුනාගත යුතු සමුච්චිත අරමුදල් යටතේ දක්වා තිබූ රු.70,823,574ක් ප්‍රමිතියට අනුව | ව්‍යාපෘතිවලින් ලැබුණු/ඉදිරියේදී ලැබෙන වත්කම් ගිණුම් ප්‍රමිතය මගින් ලබාදී ඇති උපදෙස් පරිදි ගිණුම්ගත කිරීමට කටයුතු කරමි. | හුවමාරු නොවන ගනුදෙනු වටිනාකම හුවමාරු නොවන ගනුදෙනුවලට අදාළ ප්‍රමිති අංක 11 අනුව එම අවුරුද්දේම අයහාරය ලෙස හඳුනා ගැනීමට කටයුතු කළයුතුය. |

| | | | |
|---|---|---|---|
| | ගිණුම් තැබීමට කටයුතු කර නොතිබුණි. | | |
| (ආ) | කලාප 6 ක් තුළ පිහිටි අධිකාරිය විසින් පාලනය හා නඩත්තු කරගෙන යනු ලබන කි.මී. 9,237.9 ක් දිග ඇල මාර්ග රු.74,989,140,000 කට තක්සේරු කර මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණද එම ඇල මාර්ග තක්සේරුව වෘත්තීය සුදුසුකම් සහිත පිළිගත් තක්සේරුකරුවෙකු හෝ තක්සේරු මණ්ඩලයක් විසින් සිදුකර නොතිබීම හේතුවෙන් තක්සේරු වටිනාකමේ පිළිගත හැකිභාවය අභියෝගයට ලක්ව තිබුණි. | ප්‍රධාන වේලි හා ජලාශ, වැව්, පාරවල් හා අදාල ඇල මාර්ග වල වටිනාකම් තක්සේරු කිරීම වෘත්තීය සුදුසුකම් ලත් වරලත් ඉංජිනේරුවන් විසින් පහත සඳහන් නිර්නායකයන් යටතේ තක්සේරු කර ඇත.<br>I. කුඩා, මධ්‍යම සහ මහ වැව් ඉදිකිරීමට සඳහා භාවිතා කල අමුද්‍රව්‍ය වල ප්‍රමාණය පවතින ඒකක මිලෙන් ගුණ කිරීමෙන්<br>II. පාරවල්, ප්‍රධාන, අතු බෙදුම් හා කෙත් ඇලවල් කි.මී.1 ක් ඉදි කිරීම සඳහා භාවිතා කල අමුද්‍රව්‍ය වල ප්‍රමාණය පවතින ඒකක මිලෙන් ගුණ කිරීමෙන් | අධිකාරිය සතු ඇල මාර්ග වෘත්තීය සුදුසුකම් සහිත පිළිගත් තක්සේරුකරුවකු හෝ තක්සේරු මණ්ඩලයක් මඟින් තක්සේරු කිරීම සිදු කළයුතුය. |

**1.5.6 විගණනය සඳහා ලිඛිත සාක්ෂි නොවීම**

| විෂය | මුදල | නොසැපයූ විගණන සාක්ෂි | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| | රු. | | | |
| අධිකාරියේ මූල්‍ය ප්‍රකාශනවල සී/ස මහවැලි සත්ව ව්‍යාපාරික සමාගමේ ආයෝජන | 10,000,000 | කොටස් සහතික, ප්‍රතිෂ්ඨාව තීරණය කරන ලද ආකාරය, අධ්‍යක්ෂ මණ්ඩල හා අමාත්‍ය මණ්ඩල තීරණ | මේ පිළිබඳ විස්තර සොයා බලා ඉදිරියේදි ඉදිරිපත් කිරිමට සටහන් කර ගන්නා ලදී. | ආයෝජන තහවුරු කරගැනීමට අවශ්‍ය තොරතුරු විගණනයට ඉදිරිපත් කළයුතුය. |

**1.6 ලැබිය යුතු සහ ගෙවිය යුතු ගිණුම්**

**1.6.1 ලැබිය යුතු මුදල්**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| අධිකාරියේ වත්කම් වෙනත් පාර්ශව විසින් භාවිතා කිරීමෙන් පැන නඟින ආදායම් ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති අංක 10 හි 33 වන ඡේදය ප්‍රකාරව හඳුනාගත යුතු වුවද, තඹුත්තේගම හා වලව නේවාසික ව්‍යාපාර කළමනාකරණ කාර්යාල මගින් ක්‍රියාත්මක කරන ලද කළුගල් ව්‍යාපෘතිවලට අදාළව පිළිවෙලින් | මේ පිළිබඳ පරික්ෂා කර බලා ලැබිය යුතු ආදායම් ලෙස හඳුනා ගැනිමෙන් පසු ගැලපිම කිරිමට කටයුතු කරමි.<br>බදු ලේඛණ යාවත්කාලීන කරමින් පවතින අතර 2023 වර්ෂයේ ගිණුම්වලට ගැලපීමට කටයුතු කරමි. | ලැබිය යුතු ආදායම හඳුනා ගැනීමට හා ඒවා නිසි පරිදි ගිණුම් තැබීමටත් කටයුතු කළයුතුය.<br>බාහිර පාර්ශවයන්ගෙන් අයකර ගතයුතු ආදායම් වහාම අයකර ගැනීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගතයුතුය. |

| | | |
|---|---|---|
| ව්‍යාපාරිකයින් 14 දෙනෙකු හා 16 දෙනෙකුගෙන් 2022 දෙසැම්බර් 31 දිනට අයවිය යුතු ඉඩම් පරිහරණ ගාස්තු රු.24,692,047 ක් හා රු.893,269,386 ක් ද, ලංකා පොහොර සමාගමෙන් හා මහවැලි සත්ත්ව ව්‍යාපාරික සමාගමෙන් 2022 දෙසැම්බර් 31 දිනට ලැබියයුතු පිළිවෙලින් රු.2,352,000ක් හා රු.26,100,000ක් වූ බදු ආදායම්ද හඳුනාගෙන ගිණුම්ගත කර නොතිබුණි. | මහවැලි සත්ව ව්‍යාපාරික (පුද්) සමාගමට මෙම ගොවිපල විධිමත් පරිදි බදු දී නොමැති බැවින් බදු දිම වෙනුවෙන් ලැබිය යුතු ආදායම් ගිණුම්වලට ගලපා නොමැති බව දන්වමි.<br><br>2020 දෙසැම්බර් 20 දිනැති අංක අමප/20/1852/317/012 දරණ අමාත්‍ය මණ්ඩල මඟින් මෙම හිඟ ඉඩම් පරිහරණ ගාස්තුවෙන් සියයට 25ක් පමණක් අයකර ගැනිමට අවසර දී ඇත. ඒ අනුව අයකර ගත යුතු හිඟ ඉඩම් පරිහරණ ගාස්තුව රු.223,317,346 ක් වන අතර ඉන් රු.49,772,684 ක් 2023 ඔක්තෝබර් 01 දිනට අයකර ගෙන ඇති බව දන්වා සිටිමි. | |

### 1.6.2 ගෙවිය යුතු මුදල්

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන අනුව 2022 දෙසැම්බර් 31 දිනට ගෙවිය යුතු ශේෂ එකතුව රු.39,760,813,000 ක් විය. ඉන් අවුරුදු 05 ඉක්මවූ ගෙවිය යුතු ශේෂය රු.161,080,000 ක් වූ අතර, ප්‍රධාන කාර්යාලය හා කලාප කාර්යාල පොත්වල වසර 05 ඉක්මවූ ශේෂයන්ගේ එකතුව රු.173,520,378 ක් වීමෙන් රු.12,440,378 ක වෙනසක් නිරීක්ෂණය විය. මෙම ගෙවිය යුතු ශේෂ එකතුවෙන් සියයට 98.6 ක් එනම් රු.39,231,461,000 ක් වූ අධිකාරියේ ප්‍රධාන කාර්යලීය විවිධ ණයහිමි ශේෂවල උපලේඛනයක් විගණනයට ඉදිරිපත් නොකෙරුණි. | මෙම ශේෂයන් පිළිබඳව විශ්ලේෂණයක් සිදුකර 2023 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන සමඟ නිරවුල් කිරිමට කටයුතු කරමි. | ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන අනුව දැක්වෙන ශේෂය හා කලාප කාර්යාලවල ශේෂවල එකතුන් හා අනුරූප වියයුතු බැවින්, අවශ්‍ය ගැලපීම් සහිතව විගණනයට ඉදිරිපත් කළයුතුය. විගණනයට අවශ්‍ය පරිදි උපලේඛන ඉදිරිපත් කිරීමට කටයුතු කළයුතුය. |

| | | | |
|---|---|---|---|
| (ආ) | මහවැලි කලාප 3 ක සිදුකළ ඉදිකිරීම් 3 ක් වෙනුවෙන් රාජ්‍ය ආයතන 2 කට ගෙවිය යුතු එකතුව රු.22,819,672 ක් මූල්‍ය ප්‍රකාශනවල දක්වා නොතිබුණි. | මෙම මුදලින් රු.මිලියන 2.9 ක් 2022 වර්ෂයේ ගෙවා ඇති අතර ඉතිරි මුදල (6.3-2.9) රු.මිලියන 3.04 2023 වර්ෂයේ ජර්නල් සටහනක් මඟින් ගෙවිය යුතු වටිනාකමක් ලෙස ගිණුම් ගත කර ඇත. 2023 වර්ෂයේ දී ගෙවිය යුතු ශේෂයක් ලෙස ගිණුම් ගත කරමි. | සියලු බැරකම් හඳුනාගෙන මූල්‍ය ප්‍රකාශනවල දැක්විය යුතුය. |
| (ඇ) | අධිකාරිය විසින් දිගන නේවාසික ව්‍යාපාර කළමනාකරණ කාර්යාලය සඳහා අත්පත් කරගන්නා ලද ඉඩම් අක්කර 126.23 ක් සඳහා 2018 වර්ෂයේ වන්දි ගෙවීමෙන් පසු 2022 දෙසැම්බර් 31 දිනට ගෙවිය යුතු හිඟ පොලී මුදල රු.16,252,018 ක් හා දේශීය ආදායම් කොමසාරිස් ජනරාල් වෙත ගෙවිය යුතු බදු මුදල් රු.2,006,667 ක් ගිණුම්ගත කර නොතිබුණි. 2022 වර්ෂයට අදාළව 2023 වර්ෂයේ ගෙවා තිබූ සී කලාපයේ නිල නිවාස අළුත්වැඩියා වියදම් හා රත්කිඳ බීජ ගොවිපලේ 2022/2023 මහ කන්නය වෙනුවෙන් කළ ගෙවීම්වල එකතුව රු.3,692,588 ක් 2022 දෙසැම්බර් 31 දිනට ගෙවිය යුතු ලෙස ගිණුම්ගත කර නොතිබුණි. | 2018 වර්ෂයේදී වන්දි ගෙවීමෙන් පසු 2022 දෙසැම්බර් 31 දිනට ගෙවිය යුතු හිඟ පොලී රු.16,252,018 හා දේශිය ආදයම් කොමසාරිස් ජනරාල් වෙත ගෙවිය යුතු රු.2,006,667 ක මුදල 2022 දෙසැම්බර් 31 දින වන විටත් විධිමත් පරිදි ගණනය කර නොතිබුණි. එහෙයින් ගිණුම්ගත කිරීමට නොහැකිවී ඇත. 2023 වර්ෂයේදී මූල්‍ය ප්‍රකාශනය සමඟ ගිණුම් ගත කිරීමට කටයුතු කර ඇත. | සියළු ම ගෙවිය යුතු වියදම් හඳුනාගෙන ගිණුම්ගත කිරීමට කටයුතු කළයුතුය. |

### 1.6.3 අත්තිකාරම්

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| රඹකැන්ඔය නේවාසික ව්‍යාපාර කළමනාකරණ ප්‍රදේශයේ ගල්වල යාය මහවැලි ගම්මානයේ මාර්ග සකස් කිරිම හා කුඹුරු ඉඩම් රළු මට්ටම් කිරීම සඳහා අම්පාර වාරිමාර්ග අධ්‍යක්ෂ වෙත 2013-2014 කාලපරිච්ඡේදය තුළ අවස්ථා 05 කදී රු.මිලියන 11 ක අත්තිකාරම් ලබාදී තිබුණි. එම අත්තිකාරම් මුදලින් රු.මිලියන 8.1 ක මුදලක් 2019/2020 වර්ෂවල පියවා තිබූ අතර, රු.මිලියන 2.9 ක මුදලක් 2023 අප්‍රේල් 28 දින වනවිටත් පියවා නොතිබුණි. | ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය විසින් ලබා දෙන ලද මුදලින් සියළු ගෙවීම් කර ඉතිරි ශේෂයන් නොමැති බව හා ඒ පිළිබඳ විශ්ලේෂණාත්මක වාර්තාවක් වාරිමාර්ග අධ්‍යක්ෂ (අම්පාර) ගේ අංක DI/AMP/W/06/WG/01/2023 හා දිනැති ලිපිය මඟින් ලබා දි ඇත. එහි කාර්යසාධනය විධිමත්ව සහතික කර ගැනීමෙන් පසු පියවීමේ කටයුතු සිදු කර ගැනිමට කටයුතු කරමි. | වාරිමාර්ග අධ්‍යක්ෂ විමසා කඩිනමින් අත්තිකාරම් නිරවුල් කර ගැනීමට කටයුතු කළයුතුය. |

## 1.7 නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම

| | නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| (අ) | 1981 අංක 27 දරන ඉඩම් සංවර්ධන (සංශෝධන) පනතේ 72 වගන්තිය | ඉඩම් අවසර පත්‍ර නිකුත් කිරීමේදී ඉඩම් මැන සැලසුම් සකස් කර හෝ යෝග්‍ය ඉඩම් තෝරා ගැනීම සිදුකර අවසර පත්‍ර නිකුත් කළයුතු වුවත්, 2014 වර්ෂයේ සී කලාපයේ ගිරාදුරුකෝට්ටේ කොට්ඨාශ කාර්යාලයේ පැවති ඉඩම් කච්චේරියේදී තෝරාගත් පුද්ගලයින් 99 දෙනෙකු සඳහා ඉහත අවශ්‍යතාවලින් බැහැරව හා ඉඩම් පෙන්වාදීමකින් තොරව ඉඩම් අවසර පත්‍ර ලබාදී තිබුණි. | ඉඩම් සංවර්ධන (සංශෝධන) පනතේ 72 වගන්තිය ප්‍රකාරව මහවැලි සී කලාපයේ ගිරාදුරුකෝට්ටේ කොට්ඨාශයේ 2014 වර්ෂයේදී සීමිත ඉඩම් කච්චේරියක් පවත්වා එම තේරීම් ලාභීන් වෙත නොමැනූ යටතේ මායිම් දමා අවසර පත්‍ර නිකුත් කර පසුව මායිම් පෙන්වා ඉඩම් බැහැර කර ඇත. නමුත් හොබරියාව, රත්කිඳ, තෙල්දෙණියාය සහ උල්හිටිය යන ගම්මාන වල තේරීම් ලාභීන් 184 ක් සඳහා ඉඩම් කොටස් මායිම් පෙන්වා භාර දී නොමැත. 2014 වර්ෂයේ සිට ඉඩම් පෙන්වීම සිදු කර නැති අතර 2021 වර්ෂයේ මැනුම් කටයුතු ආරම්භ කලත් එහි දී ඇති වූ විරෝධතා හේතුවෙන් නතර කිරීමට සිදු විය. එසේ වුවත් අවසර පත්‍ර නිකුත් කර ඇති පුද්ගලයන් වෙත ඉඩම් බැහැර කිරීම සඳහා ඉඩම් හඳුනාගෙන ඇති බව දන්වා සිටිමි. | බෙදාදීමට යෝග්‍ය ඉඩම් තෝරා ගෙන මැන සැලසුම් සකස් කිරීමෙන් පසු පනතේ විධිවිධාන ප්‍රකාරව ඉඩම් අවසර පත්‍ර ලබා දිය යුතුය. |
| (ආ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ මුදල් රෙගුලාසි 371(2) (ඇ) | කන්දකාඩු හා ගිරාදුරුකෝට්ටේ විදුලිවැට ඉදිකිරීම සහ එච් කලාපයේ මත්ස්‍ය මධ්‍යස්ථානය හා පොකුණු ඉදිකිරීම සඳහා අධ්‍යක්ෂ (පර්යේෂණ හා විශේෂ ව්‍යාපෘති) වෙත එකතුව රු.24,239,319 ක අත්තිකාරම් මුදල් 2021 අප්‍රේල් 21, 2021 මැයි 18 | පිළිගනිමි. මහවැලි බී කලාපයේ කන්දකාඩු ගොවිපල වටා ඉදි කල අලිවැට හා එච් කලාපයේ ඉදිකල මත්ස්‍ය අභිජනන මධ්‍යස්ථානය හා මඩ පොකුණු ඉදි කිරීම ව්‍යාපෘතිය යටතේ ලබා දෙන ලද අත්තිකාරම් පියවීමට අදාල අංශ විසින් ඉදිරිපත් කල තොරතුරු | තත්කාර්ය අත්තිකාරම් ලබාදීමේදී මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළයුතුය. අත්තිකාරම් ලබාදුන් කාර්යය නිමකර පියවීමට පෙර නැවත අත්තිකාරම් |

| | | | | |
|---|---|---|---|---|
| | | හා 2021 දෙසැම්බර් 27 දිනවල ලබාදී තිබූ නමුත්, මෙම අත්තිකාරම් විගණිත දින වූ 2023 මැයි 19 දින තෙක් වර්ෂ 02 ක පමණ කාලයක් තිස්සේ පියවා නොතිබූ අතර, අදාළ කාර්යයන් නිසි පරිදි ඉටුකරද නොතිබුණි. | ප්‍රමාණවත් නොමැති බැවින් එය විධිමත් කිරීමට අදාල අංශ දැනුවත් කර ඇත. සී කලාපයට අයත් කෘෂිකර්ම පුහුණු මධ්‍යස්ථානය වටා ඉදි කරන ලද එල්ලෙන විදුලි වැටෙහි තාක්ෂණික ගැටළු පැන නැඟී එය අධිකාරිය වෙත භාර ගැනීමට නොහැකි වූ බැවින් ඒ පිළිබඳව පරීක්ෂාකර වාර්තාව කිරීමට විශේෂ කමිටුවක් පත්කර ඇති අතර එම කමිටු වාර්තා ලැබීමෙන් පසු ඉදිරි කටයුතු සිදු කරනු ලබන බව දන්වමි. | ලබාදීම සම්බන්ධයෙන් වගකිව යුතු නිලධාරීන්ට එරෙහිව විනයානුකූල ක්‍රියාමාර්ග ගත යුතුය. |
| (ඇ) | 2003 ජුනි 02 දිනැති පීඊඞී 12 චක්‍රලේඛයේ 9.4 ඡේදය හා 2021 නොවැම්බර් 17 දිනැති අංක 01/2021 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය මගින් ස්ථාපනය කරන ලද මෙහෙයුම් අත්පොත 3.5 ඡේදය | අමාත්‍ය මණ්ඩල අනුමැතියකින් තොරව බාහිර ආයතන වෙත 2020 සිට 2023 දක්වා වූ කාලය තුල මුදාහැර සිටි නිලධාරීන්/ සේවකයින් 45 දෙනෙකු සඳහා ගෙවා තිබූ වැටුප්, සේවක අර්ථසාධක අරමුදල් හා සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් සඳහා දායක මුදල් සහ අතිකාල දීමනා පිළිවෙලින් රු.34,867,475 ක්, රු.5,440,787 ක්, හා රු.15,851,797 ක් විය. ඉන් 2023 මැයි 15 දින වනවිට ප්‍රතිපූරණය කරගැනීමට හැකිවී තිබුණේ රු.1,495,003 ක් පමණි. ඉන් සේවකයින් 31 දෙනෙකු මහවැලි ආරක්ෂක නිලධාරීන් වූ අතර, 6 වන විශ්‍රාමික ජනාධිපති ආරක්ෂක ඒකකය, අග්‍රාමාත්‍ය කාර්යාලය, වාරිමාර්ග අමාත්‍යාංශය, රාජ්‍ය ඉඩම් අමාත්‍යාංශය, මහවැලි රාජ්‍ය අමාත්‍යාංශය සහ ග්‍රාමීය කුඹුරු හා ආශ්‍රිත | බාහිර ආයතන සඳහා මුදා හැර ඇති ආරක්ෂක බලකායේ ආරක්ෂක නියාමක නිලධාරීන් අතුරින් විශ්‍රාමික ජනාධිපතිතුමා වෙත මුදා හරින ලද 05 දෙනා සහ වාරිමාර්ග අමාත්‍යාංශයට මුදා හරින ලද 14 දෙනා හැර අනෙක් ආයතන සඳහා අනුයුක්ත කරන ලද නිළධාරීන් මේ වන විට මහවැලි අධිකාරියේ රාජකාරි සඳහා වාර්තා කර ඇත.<br>වන ජීවී හා වන සම්පත් සංරක්ෂණ අමාත්‍යාංශයට සහ අග්‍රාමාත්‍ය කාර්යාලයට මුදා හරින ලද සේවකයින් වෙනුවෙන් වැයවූ මුදල් ප්‍රතිපූර්ණය කරන අතර වාරිමාර්ග අමාත්‍යාංශ ලේකම් ගේ අංක MI/F/26/MA/2022 හා 2022 සැප්තැම්බර් 05 දිනැති ලිපිය අනුව වාරිමාර්ග අමාත්‍යාංශයට මුදා හරින ලද සේවකයන් වෙනුවෙන් වැයකල මුදල් ප්‍රතිපූර්ණය නොකරයි. | චක්‍රලේඛ විධිවිධාන වලට අනුව අමාත්‍ය මණ්ඩල අනුමැතිය රහිතව අනෙකුත් ආයතන වෙත සේවකයින් මුදා නොහැරිය යුතුය. මුදා හල සේවකයන්ට අදාළ ගෙවූ පාරිශ්‍රමික ආපසු අයකර ගත යුතුය. |

| | | |
|---|---|---|
| | වැව් ජලාශ හා වාරිමාර්ග රාජ්‍ය අමාත්‍යාංශය යන ආයතනවලට නිදහස් කර තිබුණි. | අනෙකුත් ආයතන වෙත මුදාහරින ලද ආරක්ෂක නියාමකයින් වෙනුවෙන් මුදල් ප්‍රතිපූර්ණය සඳහා අදාල ආයතන වලට ලියාපදිංචි තැපෑලෙන් ලිපි යොමු කලත් එයට ප්‍රතිචාරයක් දක්වා නොමැති බව දන්වමි. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු. 1,485,127,000ක අලාභයක් වූ අතර, ඊට ප්‍රතිරූපීව ඉකුත් වර්ෂයේ ලාභය රු.665,841,000ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.2,150,968,000 ක පසුබෑමක් නිරීක්ෂණය විය. මෙම පසුබෑමට රජයේ ප්‍රාග්ධන ප්‍රදාන රු.2,948,325,000කින් අඩුවීම හා පුනරුත්ථාපන, ප්‍රජා සංවර්ධන හා නඩත්තු වියදම රු.1,232,838,000කින් අඩු වුවද ක්ෂය වියදම රු.907,448,000කින් වැඩිවීම ප්‍රධාන වශයෙන් හේතුවී තිබුණි.

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 අනාර්ථික ගනුදෙනු

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| අධිකාරියට අයත් නිල නිවාස උපයෝජනයකින් තොරව ප්‍රදේශ ගණනාවක පැවතියදී නිලධාරීන් 15 දෙනෙකු සඳහා ඔවුන් පෞද්ගලිකව කුලියට ගත් නිවාස වෙනුවෙන් 2022 වර්ෂය තුළ නිවාස කුලී ලෙස රු.3,098,129 ක් ගෙවා තිබුණි. | නේවාසික ව්‍යාපාර කළමණාකාර ඊ කලාපය 2019 වර්ෂයේ ආරම්භ කර හසලක, මිණිපේ, විල්ගමුව ප්‍රදේශ වල කෘෂිකර්ම හා සංවර්ධන කටයුතු සඳහා නේවාසික ව්‍යාපාර කලමණාකාර වික්ටෝරියා කාර්යාලයේ කාර්ය මණ්ඩලය ඊ කලාපය වෙත අනුයුක්ත කරන ලදි. එහෙත් ඊ කලාපය තුල විල්ගමුව, මිණිපේ ස්ථාපිත මහවැලි ගොඩනැගිලි නොතිබූ බැවින් කාර්යාල සහ නේවාසික පහසුකම් සඳහා පෞද්ගලික කුලී නිවාස ලබා ගැනීමට සිදු විය. මේ සඳහා අංක 2021/04 හා 2021 අප්‍රේල් 08 දිනැති දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන අනුමැතිය මත නිවාස කුලී ගෙවීම් කර ඇති බව දන්වා සිටිමි. | 2009 දෙසැම්බර් 24 දිනැති අංක 2009/12/04 දරන පාලන චක්‍රලේඛ නියෝගයන්ට අනුව කටයුතු කළයුතුය. |

## 3.2 හඳුනාගත් පාඩු

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| දේශීය කෘෂි ආයෝජන ප්‍රවර්ධන වැඩ සටහනට සමගාමීව මහවැලි බී කලාපයේ කෘෂිකර්ම සංවර්ධන වැඩසටහන යටතේ කෘෂි බෝග නිෂ්පාදන ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම සඳහා අක්කර 540 ක පමණ භූමි ප්‍රමාණයක් මුතුවැල්ල වැලිකන්ද ප්‍රදේශයෙන් ලබාදීමට 2020 වර්ෂයේ සැලසුම් කර තිබුණි. සැලසුම් කළ වර්ෂයේ සිට විගණිත දින වූ 2023 මැයි 31 දින වනවිට වර්ෂ 03 මාස 05 ක කාලයක් ගතවී තිබුණද, කිසිදු ආයෝජන ව්‍යාපෘතියක් ක්‍රියාත්මක කර නොතිබුණි. මෙම ආයෝජන ව්‍යාපෘතිවල පාරිසරික බලපෑම් ඇගයීම සඳහා රු.2,619,000 ක කොන්ත්‍රාත්තුවක් කොළඹ විශ්ව විද්‍යාලය වෙත ප්‍රදානය කර තිබූ අතර, විගණිත දින වනවිට ඉන් ගෙවා තිබූ රු.2,093,200 අධිකාරියට අලාභයක්ව තිබුණි. | මුතුවැල්ල ව්‍යාපෘතියේ පරිසර අධ්‍යන කටයුතුවල ක්ෂේත්‍ර වැඩසටහන් ආරම්භ කිරිමත් සමඟ කොරොනා වෛරසය ව්‍යාප්තිය, අවට පදිංචි කරුවන් හා භූමිය ආශ්‍රිත අනවසර පදිංචි කරුවන්ගේ විරෝධතා දැක්වීම් හා මහවැලි අධිකාරිය විසින් සැලසුම් සකස් කිරිම සඳහා කල්ගත වීම හේතුවෙන් එහි කටයුතු ඉදිරියට ක්‍රියාත්මක කරගෙනයාමට ගැටලුකාරි තත්ත්වයන් මතු විය. කොළඹ විශ්ව විද්‍යාලය විසින් අවසන් IEE වාර්තාව 2023 ජූලි 09 දින මධ්‍යම පරිසර අධිකාරියට යොමු කරන ලදී. ව්‍යාපෘතිය සඳහා පරිසර අනුමැතිය ලබාගත හැකිවූ පසු ව්‍යාපෘතියේ ඉදිරි සංවර්ධන කටයුතු කිරීමේ හැකියාව ඇත. | පාරිසරික බලපෑම ඇගයීම් වාර්තාව නිම කර ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ හැකියාව නැවත සලකා බැලිය යුතුය. |

## 3.3 කළමනාකරණ අකාර්යක්ෂමතා

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | අධිකාරියේ සම්පත් යොදා ආරම්භ කරන ලද මහවැලි පශු සම්පත් හා කෘෂි ව්‍යාපාරික (පුද්) සමාගම ව්‍යාපෘති කමිටුව විසින් තෝරාගත් බාහිර ආයෝජකයකු සමඟ රාජ්‍ය පෞද්ගලික හවුල් ව්‍යාපාරයක් ලෙස ප්‍රතිසංවිධානය කිරීම සඳහා 2018 සැප්තැම්බර් 18 දිනැති අංක අමප/18/2083/803/031 දරන අමාත්‍ය මණ්ඩල තීරණය මගින් අනුමැතිය ලබාදී විගණිත දින වනවිට වර්ෂ 4 ක් ගතවී තිබූ නමුත් රාජ්‍ය පෞද්ගලික හවුල් ව්‍යාපාරය ආරම්භ කර නොතිබුණි. | මෙම සමාගම රාජ්‍ය - පෞද්ගලික හවුල් ව්‍යාපාරයක් ලෙස (PPP) ප්‍රතිසංවිධානය කිරීම වෙනුවෙන් ආයෝජකයෙකු තෝරා ගැනීම සඳහා අවශ්‍ය ක්‍රියාමාර්ග ගනිමින් පවතී. එසේම "සමාගමේ වත්කම් පිළිබඳ තක්සේරුව ලබා ගැනිම" හා "බාහිර පුද්ගලයින් තිදෙනෙකු වෙත පවරා ඇති සමාගමේ කොටස් නැවත මහවැලි අධිකාරිය වෙත පවරා ගැනීම" සඳහා රජයේ ආයතන සමඟ එක්ව කටයුතු කළ යුතු බැවින් එම කාර්යයන් අවසන් වූ විගස අමාත්‍ය මණ්ඩලය පත්කල සාකච්ඡා සම්මුති කමිටු රැස්වීම පවත්වා ඉදිරි කටයුතු සිදු කිරිමට සැලසුම් කර ඇත. | අමාත්‍ය මණ්ඩල තීරණය ප්‍රකාරව රාජ්‍ය පෞද්ගලික හවුල් ව්‍යාපාරයක් ලෙස ප්‍රතිසංවිධානය කිරීමට කටයුතු කළයුතුය. |

| | | | |
|---|---|---|---|
| (ආ) | මහවැලි පශු සම්පත් හා කෘෂි ව්‍යාපාරික (පුද්) සමාගම පරිහරණය කරමින් සිටි ශ්‍රී ලංකා මහවැලි අධිකාරියට අයත් දෙමටගොඩ, බේස්ලයින් පාරේ පිහිටි හෙක්ටයාර 0.2139 ක ඉඩම හා ගොඩනැගිලි 2020 වර්ෂයේ නැවත මහවැලි අධිකාරියට පවරා තිබුණද, එම වත්කම් නිසි පරිදි භාරදීමට හා භාරගැනීමට එම සමාගම හා අධිකාරිය කටයුතු කර නොතිබුණි. මෙම ඉඩම 2018 වර්ෂයේ රු.මිලියන 296කට ද, ගොඩනැගිල්ල රු.මිලියන 619 කටද තක්සේරු දෙපාර්තමේන්තුව විසින් තක්සේරු කර තිබුණි. පරිශ්‍රයේ පිහිටි ගොඩනැගිලි හා අනෙකුත් වත්කම් පිළිබඳ තොරතුරු විගණනය වෙත ඉල්ලා සිටියද, විගණිත දිනය වූ 2023 මැයි 16 දින දක්වා ඉදිරිපත් නොකෙරුණි. 2023 මැයි 15 දින විගණනය විසින් පරිශ්‍රය භෞතිකව පරීක්ෂා කිරීමේදී ඉඩම තුළ පිහිටි ගොඩනැගිලි නැවත භාවිතා කළ නොහැකි අයුරින් විනාශවී ගොස් තිබුණු අතර, ගොඩනැගිලි තුළ ගෘහ භාණ්ඩ හා උපකරණ කිසිවක් නොතිබුණි. | මෙම පරිශ්‍රයේ මෙම සමාගම පිහිටුවීමට ප්‍රථම අධිකාරියේ පශු සම්පත් සංවර්ධන අංශය ස්ථාපිතව තිබී ඇති අතර 1998 වසරේදී මෙම සමාගම ලියාපදිංචි කිරීමත් සමඟම එහි තිබූ කාර්යාල උපකරණ ආදිය අළුතින් පිහිටවූ සී/ස මහවැලි පශු සම්පත් හා කෘෂි ව්‍යාපාරික (පුද්) සමාගම වෙත භාරදී එය අධිකාරිය එම සමාගම වෙත කළ ආයෝජනයක් ලෙස ගිණුම්වල දක්වා ඇත. එම නිසා අධිකාරියේ වත්කම් ලේඛණයේ දෙමටගොඩ පරිශ්‍රයේ ගොඩනැගිලි වල හා ඉඩමෙහි වටිනාකම පමණක් සඳහන්ව ඇත.<br>2021 හා 2022 වර්ෂවල ස්ථාවර වත්කම් ඇතුළු භාණ්ඩ සමීක්ෂණ වාර්තා 2023 මැයි 23 දින විගණනය වෙත භාර දී ඇත. | අදාළ දේපල තක්සේරු කර ගිණුම්ගත කිරීමට කටයුතු කළයුතුය.<br>අදාළ වත්කම් තොරතුරු විගණනයට ඉදිරිපත් කළයුතුය.<br><br>විනාශවූ හා අස්ථානගතවූ දේපල සම්බන්ධව මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කර වගකිවයුතු නිලධාරීන්ගේ හඳුනාගැනීමට හා අලාභයක් සිදුව ඇත්නම් පියවා ගැනීමට කටයුතු කළයුතුය. |
| (ඇ) | අධිකාරියට අයත් අනුබද්ධිත සමාගම් දෙකක් වන මහවැලි වෙන්චර් කැපිටල් (පුද්) සමාගම 2012 වර්ෂයේදී හා ස්වභාවික සම්පත් කළමනාකරණ (පුද්) සමාගම 2019 වර්ෂයේදී ඈවර කිරීමට තීරණය කර තිබුණද, සමාලෝචිත වර්ෂය අවසාන වන විටද ඈවර කිරීමේ කටයුතු අවසන් කර නොතිබුණි. | මෙම සමාගම් දෙක අමාත්‍ය මණ්ඩල තීරණ ප්‍රකාරව ඈවර කිරීම සඳහා ඈවරකරුවන් පත් කර ඈවරකරුවන්ගේ රැස්වීම් වාර දෙකක් ද මේ වන විට පවත්වා ඇත. ඊට අමතරව අදාළ ආයතන වෙතින් අයවීම් සම්බන්ධ තොරතුරුද කැඳවා ඇත. විධිමත් පරිදි රජයේ ගැසට් පත්‍රයේ හා ජාතික පුවත්පත් දෙකක දැන්වීම් පලකර ණයහිමියන්ගේ රැස්වීමක්ද පවත්වා ඇත. ඒ අනුව සමාගම් දෙක ඈවර කිරීමේ කටයුතු සිදු කරමින් පවතී. | සමාගම් ඈවර කිරීමේ කටයුතු කඩිනමින් නිම කළයුතුය. |

| | | | | |
|---|---|---|---|---|
| (ඇ) | | අධිකාරියට අයත් ගබඩා 43 ක් 2009 වර්ෂයේ සිට වී අලෙවි මණ්ඩලය විසින් භාවිතා කරනු ලැබුවද, එම ගබඩා වෙනුවෙන් කිසිදු කුලී මුදලක් සමාලෝචිත වර්ෂය අවසාන දින වනවිටත් අයකරගෙන නොතිබුණි. එම ගබඩාවල අයිතිය වී අලෙවි මණ්ඩලය වෙත පවරා දෙන ලෙස වී අලෙවි මණ්ඩලයේ සභාපති විසින් ඉල්ලා තිබුණද, විගණිත දින වූ 2023 මැයි 18 දක්වා ගොඩනැගිලිවල තක්සේරු වටිනාකම් තක්සේරු දෙපාර්තමේන්තුව වෙතින් ලබාගෙන කුලී අයකර ගැනීමට හෝ පවරාදීමට කටයුතු කර නොතිබුණි. | අදාළ ගබඩා සඳහා කුලී මුදල් ගෙවීමට වී අළෙවි මණ්ඩලයට හැකියාවක් නොමැති බව එහි සභාපති විසින් ලිඛිතව දන්වා තිබුණු නිසා ගබඩා කුලී ගෙවීමෙන් නිදහස් කර වි අළෙවි මණ්ඩලය වෙත පවරා ගැනිමට අමාත්‍ය මණ්ඩල අනුමැතියක් ලබා ගෙන ඉදිරිපත් කරන ලෙස සභාපති, වී අළෙවි මණ්ඩලය වෙත දැනුම් දි ඇත. එහි ප්‍රගතිය අනුව ඉදිරි කටයුතු සිදු කරමි. | මෙම ගබඩා සඳහා හිඟ බදු කුලී අයකර ගැනීමට හෝ කුලී ගෙවීමෙන් විධිමත්ව නිදහස් කිරීමට කටයුතු කළයුතුය. |
| (ඉ) | (i) | කුඩා පරිමාණව ජලවිදුලි උත්පාදනයේ යෙදෙන ආයෝජකයින් (ජල විදුලි බලාගාර හිමිකරුවන්) 12 දෙනෙකුගෙන් අධිකාරිය අයකරන ජල පෝෂක ප්‍රදේශ කළමනාකරණ ගාස්තුව අයකර ගැනීම සඳහා ලංකා විදුලිබල මණ්ඩලය, ජල විදුලි බලාගාර හිමිකරු හා මහවැලි අධිකාරිය ඇතුළත්ව විධිමත් ත්‍රෛපාර්ශවික ගිවිසුම්වලට එළඹ නොතිබුණි. ඒ හේතුවෙන් විදුලි ජනනයේ යෙදී සිටින කුඩා පරිමාණ විදුලිබලාගාර 12 න් 2021 වර්ෂය සඳහා රු.72,534,483 ක් ද, 2022 වර්ෂය සඳහා රු.169,615,000 ක් ද, ඇතුළුව එකතුව රු.242,149,483 ක් 2022 දෙසැම්බර් 31 දින වනවිට අයකර ගැනීමට නොහැකිවී තිබුණි. | කුඩා පරිමාණ ජල විදුලි ව්‍යාපෘති ආයෝජකයන් විසින් 2021 වර්ෂයේදී ඉදිරිපත් කරන ලද ඉල්ලීම් සලකා බලා එවක සිටි ජනාධිපති ලේකම්වරයා විසින් “ජල පෝෂක ප්‍රදේශ කළමනාකරණ ගාස්තුව” අයකිරීම අත්හිටුවන ලෙස ලබාදුන් තීරණය අනුව 2021 නොවැම්බර් සිට 2022 ජුනි දක්වා එම ගාස්තුව ලැබී නොමැත.<br>එසේ වුවද 2022 ජුනි මාසයේදී අදාළ ජල පෝෂක ප්‍රදේශ කළමනාකරණ ගාස්තුව නැවත අයකල හැකිවන පරිදි ජනාධිපති ලේකම්වරයා උපදෙස් ලබා දෙන ලදී. ඒ අනුව 2022 ජුනි මස සිට ජල පෝෂක ප්‍රදේශ කළමනාකරණ ගාස්තුව ලැබිය යුතු වුවද ඒ වනවිට ලංකා විදුලි බල මණ්ඩලය මුහුණ දී සිටි මූල්‍ය අර්බුදය හේතුවෙන් කුඩා පරිමාණ ජල විදුලි බලාගාරවලින් මිලදී ගත් විදුලිය සඳහා ගෙවීම් නොකල අතර ඒ අනුව ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය වෙතද ලැබිය යුතු ජල පෝෂක ප්‍රදේශ කළමනාකරණ ගාස්තුව නොලැබුණි. නමුත් මේ වනවිට එකී මූල්‍ය අර්බුදය ක්‍රමයෙන් සාමාන්‍ය වෙමින් | අදාළ ජල විදුලි බලාගාර හිමිකරුවන් සමඟ විධිමත් ත්‍රෛපාර්ශවික ගිවිසුම්වලට එළඹීමට කටයුතු කළයුතු අතර, හිඟ ජල කළමනාකරණ ගාස්තු අයකර ගැනීමට කටයුතු කළයුතුය. |

| | | | |
|---|---|---|---|
| | | පවතින බැවින්, ලංකා විදුලිබල මණ්ඩලය විසින් ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය වෙත අදාළ ජල පෝෂක ප්‍රදේශ කළමනාකරණ ගාස්තුව 2023 ජූලි මස සිට ලැබෙමින් පවතී.<br>කෙසේ වුවද ජල පෝෂක ප්‍රදේශ කළමනාකරණ ගාස්තුව ගෙවීම අත්හිටවූ 2021 නොවැම්බර් මස සිට 2022 ජූනි මාසය දක්වා කාල පරිච්ඡේදය සඳහා ජල පෝෂක ප්‍රදේශ කළමනාකරණ ගාස්තුව අයකර ගැනීමට හැකියාවක් නොමැත. | |
| (ii) | මෙම විදුලි බලාගාරවලට අමතරව මහවැලි විශේෂ බලප්‍රදේශ තුළ විදුලි ජනනයේ යෙදී සිටින කුඩා පරිමාණයේ ජල විදුලි බලාගාර 65 ක් පවතින අතර, ඒවා අධිකාරිය විසින් නියාමනය කිරීමට හා ජල පෝෂක ප්‍රදේශ කළමනාකරණ ගාස්තුව අයකර ගැනීම සඳහා විධිමත් ගිවිසුම්වලට එළඹීමට කටයුතු කර නොතිබුණි. | මෙම කුඩා පරිමාණ ජල විදුලි බලාගාර 65 ඉදිකර ඇත්තේ මෙයට වසර 15-25 තරම් පෙර වන අතර ඒවා ඉදිකිරීමේදී ශ්‍රී ලංකා මහවැලි අධිකාරියේ මැදිහත් වීමකින් තොරව ප්‍රාදේශීය ලේකම්වරුන් විසින් අදාල අනුමැතීන් ලබා දී ඇත. වර්තමානයේදී මෙම කුඩා පරිමාණ ජල විදුලි බලාගාර වලින් ජනනය කරනු ලබන විදුලිය සඳහා ලංකා විදුලිබල මණ්ඩලය විසින් මුදල් ගෙවනු ලබන්නේ ඒවායේ නඩත්තු වියදම පියවා ගැනීම සඳහා ප්‍රමාණවත් වන පරිදි පිලියෙල කරන ලද ගෙවීම් ක්‍රමයකට (Tariff) අනුවය. එසේ හෙයින් අධිකාරිය ජල පෝෂක ප්‍රදේශ කළමනාකරණ ගාස්තුවක් අයකර ගන්නේනම් එකී බලාගාර සඳහා ගෙවනු ලබන ගෙවීම් ක්‍රම ඊට අනුකූලව සංශෝධනය කල යුතු වේ. එසේ හෙයින් මෙම කුඩා පරිමාණ ජල විදුලි බලාගාර 65 වෙතින් ජල පෝෂක ප්‍රදේශ කළමනාකරණ ගාස්තුවක් අයකර ගැනීම සඳහා ගිවිසුම් ගතවීමේ හැකියාවක් දැනට නොමැත. | අදාළ ජල විදුලි බලාගාර නියාමනයට හා ඒවායින් ජල පෝෂක ප්‍රදේශ කළමනාකරණ ගාස්තු අයකර ගැනීමට සුදුසු ක්‍රමවේදයක් හඳුන්වාදීමට කටයුතු කළයුතුය. |
| (ඊ) | වලව කලාපයේ කලුගල් කැණීම් කරන ලද ව්‍යාපාරිකයින් 16 දෙනෙකු වෙතින් 2009-2020 කාල පරිච්ඡේදයට අදාලව ඉඩම් පරිහරණ ගාස්තු ලෙස | 2020 දෙසැම්බර් 20 දිනැති අංක අමප/20/1852/317/012 දරණ අමාත්‍ය මණ්ඩල තීරණය මගින් ව්‍යාපාරිකයින් 15 දෙනෙකු වෙතින් අයවිය යුතු හිඟ ඉඩම් | ඉඩම් පරිහරණ ගාස්තුවලට අදාළ හිඟ මුදල් ගෙවා පියවන තෙක් නව බලපත්‍ර නිකුත් නොකළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| | රු.1,038,026,047 ක් අයවිය යුතුව පැවතුණු අතර ඉන් විවිධ අවස්ථාවල රු.144,756,661 ක් එනම් සියයට 13.94 ක් පමණක් අයවී තිබුණි. ඒ අනුව අය නොවී පැවතුණ හිඟ ඉඩම් පරිහරණ ගාස්තුව රු.893,269,386 ක් විය. අධිකාරිය විසින් කළු ගල් කැණීම් සඳහා වාර්ෂිකව ඉඩම් පරිහරණ අවසරපත් නිකුත් කිරීමේදී පෙර වර්ෂයේ හිඟය ගණනය කර එය අයකර ගැනීමෙන් පසු නව බලපත්‍රයක් නිකුත් කිරීමට විධිමත් ක්‍රමවේදයක් අනුගමනය කර නොතිබීම හා වගකිව යුතු නිලධාරීන් අදාළ හිඟ බදු යාවත්කාලීනව අය කර ගැනීම නොසලකා හැරීම මත මෙම හිඟය ඇතිවී තිබුණි. කෙසේ වෙතත් 2020 දෙසැම්බර් 20 දිනැති අංක අමප/20/1852/317/012 දරන අමාත්‍ය මණ්ඩල තීරණය මගින් ව්‍යාපාරිකයින් 16 දෙනා වෙතින් අයවිය යුතු රු.893,269,386 ක හිඟ ඉඩම් පරිහරණ ගාස්තුවෙන් සියයට 75 ක් එනම්, රු.669,952,040 ක් කපාහැරීමටත් ඉතිරි මුදල වන රු.223,317,346 වාරික 36 කින් ගෙවීමටත් අනුමත කර තිබුණි. ව්‍යාපාරිකයින් 05 දෙනෙකු විසින් එකඟවූ පරිදි එම වාරික ගෙවීම් මුදලින් රු.157,004,041 ක් ගෙවීම පැහැරහැර තිබුණි. පැහැරහරින ලද හිඟ ගාස්තුව ප්‍රතිශතයක් ලෙස ගත්විට ගෙවීමට අනුමත කර තිබූ හිඟ ඉඩම් පරිහරණ ගාස්තුවෙන් සියයට 70 ක අගයක් විය. | පරිහරණ ගාස්තු ලෙස සඳහන් කර ඇති අතර ව්‍යාපාරිකයන් 15 දෙනා අතරින් ආර්. එල් බැසිල් රෝහණ, වයිනා ස්ටේට් කන්ස්ට්‍රක්ෂන් සමාගම, සී. කේ. දිසානායක යන අය විසින් සියලු හිඟ මුදල් ගෙවා අවසන් කර ඇත. ශ්‍රී ලංකා යුධ හමුදාව හා කේ.ජී රත්න කුමාර යන අය විසින් විධිමත්ව මාසික වාරික ගෙවමින් පවතින අතර ඉතිරි අයගෙන් මෙම මුදල් අය කර ගැනීම සඳහා පොදු දේපල පනත යටතේ ඒ ඒ ව්‍යාපෘති ක්‍රියාත්මක වන පොලිස් බල ප්‍රදේශවල පැමිණිලි ගොනු කර ඇති අතර මාගා ඉංජිනේරියන් වෙත කොළඹින් පැමිණිලි ගොනු කිරීමට කටයුතු කරන ලෙස අදාළ පොලිස් ස්ථානයෙන් උපදෙස් ලබා දී ඇත. | ඉඩම් පරිහරණ ගාස්තු නොගෙවන කැණීම්කරුවන්ට විරුද්ධව නෛතික ක්‍රියාමාර්ග ගතයුතුය. |
| (උ) | 1979 අංක 23 දරන ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය පනතේ 3 වගන්තිය අනුව ඉඩම් පරිහරණය සඳහා මූලික ව්‍යුහාත්මක සැලසුම් සකස් කර තිබුණද, 2011 වර්ෂයෙන් පසු වර්තමාන ඉඩම් පරිහරණ අවශ්‍යතා අනුව | මහවැලි කලාපවල පවතින සීමිත ඉඩම් ජාතික හා කාලීන අවශ්‍යතාවයන් පදනම් කර ගනිමින් විධිමත් ක්‍රමවේදයක් ඔස්සේ කෘෂිකාර්ම, කාර්මික හා විවිධ ව්‍යාපෘති මෙන්ම පදිංචිය සඳහා ද රජයේ ඉඩම් ලබා දීමට | වර්තමාන ඉඩම් පරිහරණ අවශ්‍යතා අනුව ව්‍යුහාත්මක සැලසුම් යාවත්කාලීන කිරීමට කටයුතු කළයුතුය. |

| | | | |
|---|---|---|---|
| | එම ව්‍යුහාත්මක සැලසුම් යාවත්කාලීන කර නොතිබුණි. | කටයුතු කරයි. ඒ මගින් ජාතික අවශ්‍යතාවයන් ඉලක්ක කරගනිමින් ආර්ථිකය ශක්තිමත් කිරීම, විදේශ විනිමය උත්පාදනය, රැකියා අවස්ථා පුළුල් කරමින් විරැකියාව දුරලීම, දිළිඳුබව පිටුදැකීම හා ප්‍රාදේශීය යටිතල පහසුකම් සංවර්ධනය ආදිය සෘජු හා වක්‍ර ලෙස ඉලක්ක කර ඇත. ඉඩම් සඳහා ආයෝජකයින් තෝරාගැනීමේ දී ඉඩම් පරිහරණ සැලැස්මට අනුව භෞතික සැලසුම් නිර්දේශය යටතේ රජයේ ඉඩම් ආඥා පනතේ විධිවිධාන ප්‍රකාරව විෂයභාර අමාත්‍යවරයාගේ අනුමැතියට යටත්ව සිදුකර ආයෝජකයින් වෙත ඉඩම් ලබාදීමට කටයුතු කර ඇත. | |

**3.4 මෙහෙයුම් අකාර්යක්ෂමතා**

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) i | සහකාර අධ්‍යක්ෂ (ඉඩම්)ගේ 2015 අගෝස්තු 24 දිනැති අංක DL/01/01 දරන මහවැලි බල ප්‍රදේශයන්වල ඉඩම් වලින් ඉවත් කරනු ලබන ඛණිජ ද්‍රව්‍ය සඳහා ගාස්තු අයකිරීම සම්බන්ධයෙන් වන ලිපිය ප්‍රකාරව බලපත්‍රයේ සඳහන් කැනීම් ප්‍රමාණය අනුව ඉඩම් පරිහරණ ගාස්තුව අයකල යුතු වුවත් අධිකාරියේ සී කලාපයේ 2016, 2017 හා 2018 වර්ෂවල මාසයක කැනීම් ප්‍රමාණයකට අදාළ ඉඩම් පරිහරණ ගාස්තුව පමණක් අයකර වැලි කැණීම් කිරීම සඳහා අවසරදී තිබුණි. මේ හේතුව මත වැලි කැණීම් බලපත්‍ර 386 කට අදාළව ඉතිරි කාල සඳහා අයවියයුතු ඉඩම් පරිහරණ ගාස්තුව රු.278,685,665 ක් අයකර ගැනීමට නොහැකිවී තිබුණි. කෙසේ වෙතත් අධිකාරියට රු.278,685,665 ක ආදායමක් අහිමි කිරීම සම්බන්ධ වගකිවයුතු නිලධාරීන් කවුරුන්ද යන්න හා කැණීම් බලපත්‍ර | මහවැලි සී කලාපයේ 2016, 2017, 2018 වර්ෂවල මාසයකට අදාළ ඉඩම් පරිහරණ ගාස්තු පමණක් අයකර වැලි කැනීම් කිරීම සඳහා වැලි කැනීම් බලපත්‍ර 386 කට අදාල ඉතිරි කාල සඳහා අයකර ගතයුතු ඉඩම් පරිහරණ ගාස්තු රු.278,685,665 ක ආදායමක් රජයට අහිමි කිරීම සම්බන්ධයෙන් වගකිවයුතු නිලධාරීන් හදුනාගැනීම සඳහා වාරිමාර්ග අමාත්‍යාංශය ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම්ගේ සභාපතිත්වයෙන් යුත් කමිටුවක් මගින් පරීක්ෂණයක් සිදු කර එම විමර්ශනයේ නිර්දේශ මේ වන විට ක්‍රියාත්මක කර ඇත. | වක්‍රලේඛයන්ට පටහැනිව කටයුතු කරමින් අධිකාරියට අය වියයුතු ආදායම් අහිමි කිරීමට වගකිවයුතු පාර්ශවයන් ගෙන් මෙම මුදල් අයකර ගැනීමට නොපමාව කටයුතු කළයුතුය. |

| | | | |
|---|---|---|---|
| | ලබාදීමේදී වගකීම් විරහිතව ක්‍රියාකළ හා පසුව ඒ සම්බන්ධ නිසි අධීක්ෂණයක් සිදුනොකළ නිලධාරීන් කවුරුන්ද යන්න පිළිබඳව පරීක්ෂණ සිදුකර වගකිවයුතු නිලධාරීන්ට එරෙහිව ක්‍රියාමාර්ග ගැනීමට අධිකාරිය විසින් කටයුතු කර නොතිබුණි. | | |
| ii | මෙවැනි ගැටළු මතු නොවීම සඳහා ගනු ලබන ක්‍රියාමාර්ග යටතේ 2019 පෙබරවාරි 21 දින පැවති පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභා රැස්වීමේදී මහවැලි ගඟ දෙපස මීටර 60 ක රක්ෂිත මායිම් සලකුණු කිරීමට එකඟවී තිබූ අතර, ඒ සඳහා 2018 වර්ෂයේ රු.1,000,000 ක් 2019 වර්ෂයේ රු.612,300 ක් ද ලෙස එකතුව රු.1,612,300 ක මුදලක් ශ්‍රී ලංකා මිනින්දෝරු දෙපාර්තමේන්තුවට ගෙවා තිබූ නමුත්, විගණිත දින වූ 2023 ජුනි 19 දක්වා මැනීම් කටයුතු සිදුකර රක්ෂිත මායිම් සලකුණු කර නොතිබුණි. | මහවැලි සී කලාපයේ 2016, 2017, 2018 වර්ෂවල මාසයකට අදාළ ඉඩම් පරිහරණ ගාස්තු පමණක් අයකර වැලි කැනීම් කිරීම සඳහා වැලි කැනීම් බලපත්‍ර 386 කට අදාල ඉතිරි කාල සඳහා අයකර ගතයුතු ඉඩම් පරිහරණ ගාස්තු රු.278,685,665 ක ආදායමක් රජයට අහිමි කිරීම සම්බන්ධයෙන් වගකිවයුතු නිලධාරීන් හඳුනාගැනීම සඳහා වාරිමාර්ග අමාත්‍යාංශ ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම්ගේ සභාපතිත්වයෙන් යුත් කමිටුවක් මඟින් පරීක්ෂණයක් සිදු කර එම විමර්ශනයේ නිර්දේශ මේ වන විට ක්‍රියාත්මක කර ඇත. | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම නිරීක්ෂණය හා නොගැලපේ. පොදු ව්‍යාපාර කාරක සභාවේ නියෝග පරිදි මිනින්දෝරු දෙපාර්තමේන්තුවේ සහයෙන් රක්ෂිත මායිම් සළකුණු කිරීමේ කාර්යය කඩිනමින් නිම කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගතයුතුය. |
| (ආ) | තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය ඉඩම් කළමනාකරණයට හඳුන්වාදීම සඳහා අධිකාරිය විසින් 2016 හා 2018 වර්ෂවලදී රු.6,973,405 ක් වැයකර ඉඩම් තොරතුරු පද්ධතියක් ස්ථාපිත කර තිබුණු අතර, පද්ධතිය ක්‍රියාත්මක කිරීම සඳහා නිලධාරීන් 60 ක් පුහුණු කිරීමටද කටයුතු කර තිබුණි. එසේ වුවද විගණිත දින වූ 2023 අගෝස්තු 09 වනවිටද ඉඩම් කළමනාකරණ තොරතුරු පද්ධතිය නිසි පරිදි ක්‍රියාත්මක නොවීම නිසා එම වියදම නිශ්කාර්ය වියදමක් බවට පත්වී තිබුණි. | ඉඩම් කළමනාකරණය කාර්යක්ෂම කරලීම අරමුණු කර ගනිමින් ඉඩම් කළමනාකරණ (E-Slims) දත්ත පද්ධතිය 2016 වර්ෂයේ හඳුන්වා දී ඇත. ඒ අනුව 2019 වසර වන විට ඉඩම් කැබලි පන්දහසකට අධික ප්‍රමාණයක තොරතුරු ඊට ඇතුළත් කර ඇත. නමුත් මෙම වැඩසටහන සඳහා පුහුණු කළ නිලධාරීන් 60 දෙනා උසස්වීම් ලැබීම හා සේවයෙන් ඉවත්වීම නිසා වැඩසටහනට යොදවා ගැනීමට නොහැකි වීම, කොරෝනා වසංගතය, 2019 වසරේ දී ඉඩම් ඔප්පු ලබා දීමේ කඩිනම් වැඩ සටහන සඳහා සියලු නිලධාරීන් යොදවා ගැනීම හා රජයේ දත්ත අවකාශය LGC1 සිට LGC2 දක්වා මාරු කිරීම යන කරුණු හේතුවෙන් අදාල දත්ත පද්ධතිය අක්‍රීය වීම මත දත්ත ඇතුලත් කිරීම නතරවී ඇත. | ඉඩම් කළමනාකරණ තොරතුරු පද්ධතිය නිසි පරිදි ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග කඩිනමින් ගතයුතුය. |

| | | | |
|---|---|---|---|
| | | 2023 මැයි 23 හා 2023 අගෝස්තු 10 යන දිනවල පැවති පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාවේදී කරන ලද නිර්දේශ පදනම්ව කොළඹ විශ්වවිද්‍යාලයේ පරිගණක විශේෂඥ සහය ලබා ගනිමින් 2023 වසරේදී මෙම පද්ධතිය යාවත්කාලීන කිරීම ආරම්භ කර ඇති අතර, 2024 අප්‍රේල් මස වනවිට ඉඩම් දත්ත ඇතුළත් කර අවසන් කිරීමට සැලසුම් කර ඇත. | |
| (ඇ) | විගණනයට ඉදිරිපත් කර තිබුණු තොරතුරු අනුව අධිකාරියට අයත් බී, සී,ඩී, ජී, එච්, එල්, ඊ, හුරුළුවැව, වලව යන කලාපවල සහ ජලාශ හා මෙහෙයුම් අංශය යටතේ පවතින ජලාශ රක්ෂිතවල 2023 ජූලි 03 දින වනවිට අනවසරයෙන් භුක්ති විඳින ඉඩම් කට්ටි ප්‍රමාණය 2544 ක් සහ පුද්ගලයින් ප්‍රමාණය 402 ක් විය. | | |
| | (i) මේ අතරින් අනවසර පදිංචිකරුවන් ඉවත් කිරීම සඳහා කලාප මට්ටමින් කට්ටි 910 ක් සඳහා ආයතනික ක්‍රියාමාර්ග ගෙන තිබූ අතර, කට්ටි 145 ක් සඳහා නීතිමය ක්‍රියාමාර්ග ගෙන තිබුණි. අධ්‍යක්ෂ (ජලාශ හා මෙහෙයුම්) යටතේ පවතින ජලාශ රක්ෂිතවල අනවසර පදිංචිකරුවන් ඉවත් කිරීම සඳහා වන ක්‍රියාමාර්ග අතුරින් 150 දෙනෙකු වෙනුවෙන් ආයතනික ක්‍රියාමාර්ගද, 185 දෙනෙකු වෙනුවෙන් නෛතික ක්‍රියාමාර්ගද ගෙන තිබුණි. මේ අනුව ඉතිරි කට්ටි 1489 හි පදිංචිකරුවන් 67 ක් ඉවත් කිරීම සඳහා විගණිත දින වූ 2023 අගෝස්තු 09 වනවිටත් | තවදුරටත් භුක්තිය දරන අනවසරකරුවන්ට එරෙහිව නෛතික ක්‍රියා මාර්ග ගැනීම සඳහා රක්ෂිත ඉඩම් මැනීම මිනින්දෝරු දෙපාර්තමේන්තුව සමඟ සම්බන්ධවී සිදුකිරීමට සූදානම් කර ඇත. ඊට අමතරව අනවසර ක්‍රියාකාරකම් 1489 න් 547 ක් පමණ අනවසරයෙන් මහ කන්නයේ වී වගා කටයුතු සිදු කල අතර කලාපීය මට්ටමින් දැනුවත් කිරීම සිදු කර එම අනවසරයෙන් ඉඩම්වලට ඇතුලුවීම වලක්වා ඇත. ස්ථිර බෝග වගා කරන ලද අනවසරයෙන් පුද්ගලයින් 651ක් වන අතර ඔවුන්ට එරෙහිව ආයතනික ක්‍රියාමාර්ග හා නෛතික ක්‍රියාමාර්ග ගැනීම ආරම්භ කර ඇත. තවද අනවසරයෙන් ඉඩම් භුක්ති විඳි පුද්ගලයින් 17 ක් පමණ ඉවත් කිරීමට කටයුතු කර ඇත. ස්ථිර නිවාස ඉදිකර ඇති පුද්ගලයින් | ජලාශ රක්ෂිත හා කලාපවල අනවසරයෙන් භුක්ති විඳින ඉඩම් කඩිනමින් අධිකාරිය වෙත ලබා ගැනීමට අවශ්‍ය කටයුතු සිදු කළයුතුය. |

| | | | |
|---|---|---|---|
| | කිසිදු ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි. | පදිංචි ඉඩම් හඳුනා ගැනීම සඳහා මැනුම් කටයුතු කිරීමට අවශ්‍ය කටයුතු සිදු කරමින් පවතී.<br>අධ්‍යක්ෂ (ජලාශ හා මෙහෙයුම්) යටතේ පවතින ජලාශ රක්ෂිතවල අනවසරකරුවන් ඉවත් කිරීම සඳහා මායිම් හඳුනාගත යුතු අතර ඒ සඳහා මැනුම් කිරීමට අවශ්‍ය කටයුතු සිදුකරමින් පවතී. ඊට අමතරව අනවසරකරුවන් 67 දෙනාගෙන් 57 ක් සඳහා ඉඩමෙන් ඉවත්වන ලෙස ලිපි නිකුත් කර ඇති අතර එම අනවසරකරුවන් ඉවත් කිරීම සඳහා ආයතනික ක්‍රියාමාර්ග ගෙන ඇත. | |
| (ii) | මෙලෙස ජලාශ රක්ෂිතවල වාණිජමය පදනමින් ඉඩම් අත්පත් කර ගැනීම් හා ගොඩනැගිලි ඉදිකිරීම් වූ අතර, සී කලාපයේ උල්හිටිය පිටවාන ආසන්න ජලාශ රක්ෂිතයේ ක්‍රිස්බෝ ආයතනය විසින් ඉදිකරන ලද ගොඩනැගිල්ල සහිත ඉඩම හා ඉඩමට යාබදව නිවසක් සහිත ඉඩමද අධිකාරියේ රත්කිඳ සංචාරක නිවාසය ආසන්නයේ පෞද්ගලික සංචාරක නිවාසයක් ලෙස අනවසරයෙන් පවත්වාගෙන යනු ලබන හෝටල් ගොඩනැගිල්ල සහ ඉඩම විගණනය මගින් නිරීක්ෂණය කර තිබුණි. | මහවැලි සී කලාපයේ ගිරාඳුරුකෝට්ටේ කොට්ඨාශයෙන් ගෝල්ඩන් ග්‍රේන්ස් (පුද්) සමාගම (ක්‍රිස්බෝ) වෙත කෘෂිකාර්මික ආයෝජන ව්‍යාපෘතියක් සඳහා දීර්ඝකාලීන බදු පදනම මත ඉඩම් බැහැර කර ඇති අතර එම සමාගම විසින් නිල නිවසක් ඉදිකිරීම සඳහා උල්හිටිය ජලාශයේ පහල උල්හිටිය ඔය අසලින් අක්කර ½ ක බිම් කොටසක් ඉල්ලුම්කර ඇත. ඒ සඳහා භෞතික සැලසුම් කමිටු අනුමැතිය ලැබීමෙන් පසු විධිමත් අනුමැතිය ලබාදීම සඳහා යොමු කර ඇත.<br>2003/2004 මහවැලි සේවක ඉඩම් කච්චේරි මඟින් පුද්ගලික පාර්ශවයක් වෙත තේරී ඇති ඉඩම මහවැලි සී කලාපයේ උල්හිටිය ප්‍රදේශයෙන් බැහැර කර ඇති අතර එම ඉඩම සඳහා එල්/10/02/සී/ගිරා/රඹ/නිදි/නිවා/02 අංක දරණ නිදහස් දීමනා පත්‍රයක් සකස් කර යොමුකර ඇත. ඒ අනුව අංක 01 නිවාසය සංචාරක නිකේතනයක් පවත්වාගෙන යාම සඳහා ගොඩනැගිල්ල භාරදී බදු මුදල් අය කිරීමට ගිවිසුම් ගතවීමක්ද සිදුකර ඇත. | චක්‍රලේඛ ප්‍රකාරව අධිකාරිය සතු සංවේදී ප්‍රදේශ ආරක්ෂා කර ගැනීමට අවශ්‍ය කටයුතු සිදු කළයුතුය. |

| | | | |
|---|---|---|---|
| (ඈ) | අධිකාරිය සතු පැල තවාන් 11 කින් 06 ක් සහ ගොවිපලවල් 21කින් 13 ක් සමාලෝචිත වර්ෂයේ අලාභ ලබා තිබුණු අතර, එම අලාභය පිළිවෙලින් රු.27,429,000 ක් හා රු.72,452,000 ක් විය. | පැල නිෂ්පාදන වියදම අධික වීම මෙන් ම පැලයක වර්තමාන වෙළෙඳපොල මිල අනුව අධිකාරියේ පැල තවාන්වලට අවශ්‍ය කරන පැල වර්ග ලබාදිය නොහැකිවීම හා පැල ගොවිපලේ සහන මිලට ලබාදීම, 2021 වසර තුළ රට තුළ පැවති අර්බුදකාරී තත්ත්වය මත පැල සිටුවීම හා මිලදී ගැනීම අඩුවීමද මෙයට බලපා ඇත. 2022 වර්ෂයේ දී ගොවිපල 17 න් ගොවිපල 7 ක් ලාභදායී ආදායම් උත්පාදන ඒකක ලෙස සංවර්ධනය කර ඇති අතර රු.මිලියන 146.64 ක ඍජු වියදම් දැරීමකින් උපයාගත් මුළු ආදායම රු.මිලියන 193.57 කි. ගණනයේ දී රු.මිලියන 24.26 ක අලාභයක් පෙන්නුම් කරන නමුත් මෙමගින් කලාපීය ගොවි ප්‍රජාව වෙත සලසන සේවා, තාක්ෂණික හා න්‍යායාත්මක දැනුම ලබාදීම පිළිබඳ සැලකීමේදී ලාබදායී නොවන ගොවිපලද ඵලදායී ගොවිපල ලෙස සැලකිය හැකිය. | පිරිවැය අවම වන උපක්‍රම හා ආදායම ඉහළ නංවන උපක්‍රම අනුගමනය කර ලාභදායීත්වය ඉහළ නංවා ගැනීමට කටයුතු කළයුතුය. |
| (ඉ) | 2022 දෙසැම්බර් 31 දිනට අධිකාරිය විසින් ආයෝජන ව්‍යාපෘති සඳහා ආයෝජකයන් 704 දෙනෙකු වෙත හෙක්ටයාර 7832 ක ඉඩම් ප්‍රමාණයක් ලබාදී තිබුණි. ඉන් පූර්ණ වශයෙන් සංවර්ධනය කර තිබුණේ ඉඩම් හෙක්ටයාර 3645 ක් පමණක් වූ අතර, පූර්ණ වශයෙන් අසංවර්ධිතව ඉඩම් හෙක්ටයාර 2697 ක් පැවතුණි. සංවර්ධනය කරමින් පවතින ඉඩම් කට්ටි ප්‍රමාණයෙන් සියයට 5 ත් 25 ත් අතර සංවර්ධිත ඉඩම් හෙක්ටයාර 377 ක් ද, සියයට 25 ත් 50 ත් අතර සංවර්ධිත ඉඩම් හෙක්ටයාර 291 ක් ද, පැවතුණි. ඒ අනුව ලබාදුන් දුන් ඉඩම් ප්‍රමාණයෙන් සියයට 34 ක් පූර්ණ අසංවර්ධිතවත්, සියයට 09 ක් ඌන හා සංවර්ධනය වෙමිනුත් පැවතුණි. මෙම ඉඩම් ආර්ථික හා සමාජයීය ප්‍රතිලාභ | ආයෝජන ඉඩම් බැහැර කිරීමේදී එම ඉඩම් හඳුනා ගැනීමෙන් පසු හඳුනාගත් ආයෝජන ඉඩම් සඳහා පුවත්පත් දැන්වීම් මගින් අභිලාෂයන් කැඳවීම හෝ රජයේ ඉඩම් ආඥා පනතේ ප්‍රතිපාදන මත වරණීය පදනම යටතේ ආයෝජකයින් තෝරාගැනීමේ ක්‍රමවේදය අනුගමනය කර ඇත. ඉඩම්, ඉඩම් පරිහරණ සැලැස්මට අනුව භෞතික සැලසුම් නිර්දේශය යටතේ විධිමත් ක්‍රමවේද අනුගමනය කරමින් රජයේ ඉඩම් ආඥා පනතේ විධිවිධාන ප්‍රකාරව ගරු විෂයභාර අමාත්‍යවරයාගේ අනුමැතියට යටත්ව ආයෝජකයින් වෙත ලබාදීමට කටයුතු කර ඇත. | පූර්ණ අසංවර්ධිතව පවතින ව්‍යාපෘති අවලංගු කර, ඒ සඳහා බැහැර කර ඇති ඉඩම් ආපසු ලබාගැනීමටත්, ඉතිරි ව්‍යාපෘති, ව්‍යාපෘති යෝජනාවලට අනුකූලව ක්‍රියාත්මකද යන්න කාලීනව අධීක්ෂණය කිරීමටත් කටයුතු කළයුතුය. |

| | | | |
|---|---|---|---|
| | ලැබෙන අයුරින් ආයෝජන කාර්යයන්හි යෙදවීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. | | |
| (ඊ) | දේශීය ආහාර නිෂ්පාදනය ඉහළ නැංවීම හා විදේශීය මුල්‍ය පහසුකම් යටතේ ආයෝජන අවස්ථා සඳහා ඉඩම් ලබාදීම යටතේ ආයෝජකයන් 04 දෙනෙකු වෙත රඹකැන්ඔය කලාපයේ පොල්ලේබැද්ද ප්‍රදේශයෙන් අක්කර 1750 ක් ලබාදී තිබුණි. ඉන් RAN ප්ලාන්ටේෂන් ආයතනය වෙත බඩඉරිඟු වගාව සඳහා ලබාදී තිබූ අක්කර 500 එම ආයතනය විසින් අතහැර දමා තිබූ අතර, මොරගොඩ ඇග්‍රෝ සර්විස් වෙත මූලිකව නිදහස් කර තිබූ අක්කර 250 සඳහා 2023 මාර්තු 28 දක්වාම බදු අනුමැතියක් ලබාදී හෝ බදු අයකරගෙන නොතිබුණු අතර, එකඟවූ පරිදි රු.1,125,000 ක කාර්යසාධන බැඳුම්කරයක් ලබා ගැනීමටද කටයුතු කර නොතිබුණි. හෙනා වගාව සඳහා CSW ප්ලාන්ටේෂන් ආයතනය වෙත අක්කර 100 ක් ලබාදී තිබුණු අතර, 2020 දෙසැම්බර් සිට විගණිත දින වූ 2023 අප්‍රේල් 28 දින දක්වා හිඟ බදු රු.1,800,000 අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. ඉංජිනේරුමය කාර්යයන් පිළිබඳ මධ්‍යම උපදේශක කාර්යාංශයට ඉඩම් අක්කර 150 ක් ලබාදී තිබූ අතර, විධිමත් පරිදි මැනුම් සිදුකර ගිවිසුමකින් ලබාදී නොතිබුණි. | RAN ප්ලාන්ටේෂන් ආයතනය වෙත බඩ ඉරිඟු වගාව සඳහා ආසන්නම ඉඩමේ රජයේ තක්සේරුව මත මත පදනම්ව ඉඩම භාර දී ඇත. එම ආයොජකයා වෙත ඉඩම් මායිම් පෙන්වන අවස්ථාවේදී ගැටළුකාරී තත්ත්වයක් ඇති වූ බැවින් වගා කල හැකි වූ ප්‍රමාණයට පමණක් පසුව කාර්යය සාධක බදු මුදල වූ රු.555,750 ක මුදලක් ගෙවා ඇත. මෙම ඉඩම සඳහා අභියාචනාධිකරණයේ නඩුවක් පවරා ඇති බැවින් නීතිපති දෙපාර්තමේන්තුව විසින් දන්වා ඇති පරිදි ඉඩමේ සංවර්ධන කටයුතු නතර කර ඇත. බඩඉරිඟු වගාව සඳහා සී.එස්.ඩබ්. හර්බල් ප්ලාන්ටේෂන් ආයතනය මගින් කාර්යසාධන බදු මුදල වශයෙන් රු.450,000ක් ගෙවා ඇති අතර වාර්ෂික බදු මුදල අයකර ගැනීමට උපදෙස් ලබා දී ඇත.<br>ඉංජිනේරුමය කාර්යයන් පිළිබඳ මධ්‍යම උපදේශක කාර්යාංශය වෙත කොන්දේසි ඇතුලත් භුක්තිය භාරදීමේ වාර්තාවක් මගින් ඉඩම් බැහැර කර ඇති අතර මේ දක්වා අයවීමට ඇති බදු මුදල් අයකර ගැනීමට උපදෙස් ලබා දී ඇත. | අතහැර දමා ඇති ඉඩම නැවත ලබාගත යුතු අතර, හිඟ බදු අයකර ගැනීමට අවශ්‍ය පියවර ගතයුතුය.<br>ලබා නොදුන් කාර්යසාධන බැඳුම්කරය නොපමාව ලබා ගතයුතු අතර, අනුමැතිය සහිතව විධිමත්ව ඉඩම් බදු දිය යුතුය.<br>ඉඩම් බදු දීමේ අරමුණ ඉටුකරනු ලබන්නේ ද යන්න නිරන්තරයෙන් පසු විපරම් කළ යුතුය. |
| (උ) | බී කලාපයේ දම්මින්න කොට්ඨාශයේ අළුත්වැව ඒකකයෙන් කෘෂිකාර්මික ව්‍යාපෘති යටතේ පොල් වගා කිරීම සඳහා සී/ස නව ලංකා සමාගමට දීර්ඝකාලීන බදු පදනම මත අක්කර 100 ක් ලබාදී තිබුණි. එහිදී මෙම අක්කර 100 ට අදාළව රජයේ | එන්.කේ.එන්.එල්.කන්ස්ට්‍රක්ෂන් ඇන්ඩ් ඩිවලොප්මන්ට් ආයතනය වෙත දිගුකාලීන බදු පදනම මත මෙම ඉඩම ලබා දී ඇත. සම්පූර්ණ සංවර්ධනය කර බදු කාලය අවසන් කර ඇත. නව බදුකරයක් ලබා දීමේදී අක්කර 50 ට වැඩි ඉඩමක් බැවින් අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබා ගෙන බදු | බදු කාලය අවසන්වීමත් සමඟ ඉඩම් තක්සේරුකර නව බදු ගිවිසුම්වලට එළඹීමටත්, චක්‍රලේඛ ප්‍රකාරව බදු සංශෝධන යාවත්කාලීනව සිදුකොට හිඟ බදු අයකර ගැනීමටත් කටයුතු කළයුතුය. |

ඉඩම් ආඥා පනත යටතේ 1983 දෙසැම්බර් 13 දින සිට අවුරුදු 30 ක කාලයකට අදාළව දීර්ඝකාලීන බලපත්‍රයන් ඉහත සමාගමට ලබාදී තිබුණු අතර, බදු කාලය 2013 දෙසැම්බර් 14 දිනෙන් අවසන්වී තිබුණි. බදු කාලය අවසන්වීමට පෙර එය තවදුරටත් එම සමාගමටම ලබාදීමට හෝ වෙනත් ඉල්ලුම්කරුවෙකුට ලබාදීමට අවශ්‍ය තීන්දු හා ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. අනතුරුව ඉඩම සඳහා තක්සේරුවක් ලබාගෙන ඒ මත බදු මුදල් අයකර නොගෙන අක්කර 100 සඳහාම වර්ෂයකට රු.7,302 බැගින් 2013 සිට 2017 දක්වාද, වර්ෂයකට රු.8,764 බැගින් 2018 සිට 2021 දක්වා ද එකතුව රු. 80,330 ක මුදලක් අදාළ සමාගමෙන් අයකර තිබුණි. කෙසේ වෙතත් මෙම ඉඩම සඳහා වෙනත් ආයතනයක් දීර්ඝකාලීන බද්දක් ලබා දෙන ලෙස 2013 වර්ෂයේ සිට ඉල්ලීම් කරමින් පැවති අතර, එහිදී ලබාගත් රජයේ තක්සේරුව අනුව මෙම පොල් වගාව සහිත අක්කර 100 හි තක්සේරු වටිනාකම 2013 දෙසැම්බර් 12 දිනට රු.1,500,000 ක් වී තිබුණි. විගණිත දින වූ 2023 අගෝස්තු 09 වන විටද අදාළ ඉඩම සඳහා කිසිදු ආයතනයක් සමඟ බදු ගිවිසුමකට එළඹීමට කටයුතු කර නොතිබුණි.

අනුමැතියක් ලබා ගත යුතුය. දිගුකාලීන බදු කාලය අවසන් වූ පසු සාමාන්‍ය ක්‍රමවේදය මත නව බදු අනුමැතියක් ලබා ගෙන මුල් ආයෝජකයාට ඉඩම ලබා දීමට කටයුතු කරනු ලැබේ. වසර 30 ක් අවසන් වූ ඉඩම් සඳහා නැවත බදුකරය ලබා දීමට මේ වන විට අවශ්‍ය කටයුතු සිදු කරමින් පවතී.

(ඒ) දීර්ඝකාලීන බදු පදනමට වලව කලාපයේ ඉඩම් බදුදී ඇති ආයෝජන ව්‍යාපෘති 03 ක් වෙනුවෙන් 2022 දෙසැම්බර් 31 දිනට හිඟව ඇති රු.19,919,338 ක් වූ හිඟ බදු මුදල් විගණිත දින වූ 2023 අප්‍රේල් 03 දින වන විටත් අය කරගෙන නොතිබුණි. එම ආයතන අතුරින් ආයතන 2 ක් අදාළ ඉඩම් බදුගත් අරමුණු සඳහා යොදවා නොතිබුණි.

බදුකරුවන් තිදෙනා අතරින් එක් ආයෝජකයකු ගේ
විගණිත දින වන විට මුළු බදු හිඟය රු. 6,540,763 ක් හඳුනා ගෙන ඇති අතර මෙම ආයෝජකයා විසින් අදාළ ඉඩම අවලංගු කිරීමට එරෙහිව අභියාචනාධිකරණයේ නඩුවක් ගොනුකර ඇත. සියළුම හිඟ බදු මුදල් ගෙවීමෙන් අනතුරුව සංවර්ධනය සඳහා ඉඩම ලබා

ඉඩම් ලබාදීමේ පරමාර්ථ ඉටුකර ගතහැකි පරිදි ඉඩම් සංවර්ධනය කරන්නේ ද යන්න පිළිබඳ පසු විපරම් කළයුතු අතර, සංවර්ධනය නොකරන ඉඩම් නැවත පවරා ගෙන සුදුසු කාර්යයන් සඳහා භාවිතා කළයුතුය.
හිඟ බදු මුදල් කඩිනමින්

| | | |
|---|---|---|
| | දීමට නඩුවේ සමතය සඳහා කටයුතු කරමින් පවතී. දෙවන ආයෝජකයා වූ ජාත්‍යන්තර පාසල වෙතින් හිඟ බදු මුදල් ලෙස රු.11,854,160 ක මුදලක් පවතින අතර එම මුදල අයකර ගැනීම සඳහා එන්තරවාසි යොමු කර ඇතත් හිඟ බදු ගෙවා නැත. ඉඩම අවලංගු කිරිම සඳහා කටයුතු කරමින් පවතී. තුන් වන ආයෝජකයා වෙත හිඟ බදු මුදල වූ රු.2,168,618 ගෙවන ලෙස දන්වා ඇති අතර, බදු මුදල අයකර ගැනීම සඳහා නෛතික කටයුතු ආරම්භ කිරිමට එන්තරවාසි යවා ඇත. | ලබා ගැනීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගතයුතුය. |

## 3.5 අරමුදල් ඌන උපයෝජනය

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| මහවැලි ජනපදිකයින් සඳහා ණය ලබාදීමේ චක්‍රීය ණය යෝජනා ක්‍රමයක් ඇති කිරීම සඳහා මහා භාණ්ඩාගාරයෙන් ලද රු.මිලියන 50 ක මුදලක් 2006 වර්ෂයේ ලංකාපුත්‍ර සංවර්ධන බැංකුවට ලබාදී තිබුණි. ලංකාපුත්‍ර සංවර්ධන බැංකුව අහෝසි වූ පසු ප්‍රාදේශීය සංවර්ධන බැංකුව වෙත අදාළ තැන්පතුව මාරුවී තිබූ අතර, විගණිත දින වන 2023 අප්‍රේල් 28 වනවිටත් මෙම මුදල අදාළ අරමුණ සඳහා යෙදවීමකින් තොරව තැන්පතුවක් ලෙස පවත්වාගෙන ගොස් තිබුණි. මීට අදාළව 2022 දෙසැම්බර් 31 දිනට ලැබුණු පොලිය රු.මිලියන 26.196 ක් බව එම බැංකුවෙන් තහවුරු කර තිබුණි. | ප්‍රාදේශීය සංවර්ධන බැංකුවේ තැන්පත් මුදල වන රු.මිලියන 50 සඳහා වර්තමානය වනවිට රු.මිලියන 26.196 ක පොලී ආදායම සමඟ මුළු එකතුව රු.මිලියන 76.196 ක ශේෂයක් ප්‍රාදේශීය සංවර්ධන බැංකුවේ පවතින බවට සනාථ කර ඇත.<br>මේ වනවිට ප්‍රාදේශීය සංවර්ධන බැංකුව උක්ත පරිදි ණය යෝජනා ක්‍රමය ක්‍රියාත්මක කිරිමට යෝජිත අවබෝධතා ගිවිසුම් කෙටුම්පතක් මහවැලි අධිකාරිය වෙත ලබා දී ඇති අතර විධිමත් ගිවිසුම සකස් කිරීම නීති අංශය මඟින් සිදු කරගෙන යයි.<br>2023 දෙසැම්බර් 31 වනවිට ව්‍යවසායකයින් 100 කට ණය ලබා දී අවසන් කිරීමට සැලසුම් කර ඇත. | උපයෝජනයෙන් තොරව පවතින මහා භාණ්ඩාගාරයෙන් ලද මුදල් අදාළ අරමුණ සඳහා යෙදවීමට අවශ්‍ය පියවර නොපමාව ගත යුතුය. |

**3.6 නිෂ්කාර්ය හෝ ඌන උපයෝජිත දේපල, පිරියත හා උපකරණ**

| | | විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| (අ) | (i) | 2020 ජූනි 26 දිනැති අංක 2181/25 දරන රජයේ ගැසට් පත්‍රය මඟින් මහවැලි ජී කලාපය කාබනික කලාපයක් ලෙස ගැසට් කිරීමට අධිකාරිය කටයුතු කර තිබුණු අතර, ඒ සඳහා ජී කලාපයේ වැල්ලේවෙල ප්‍රදේශයේ රු.20,278,462 ක් වැය කර කොම්පෝස්ට් නිෂ්පාදන අංගනයක් හා එහි අඩි 40x60ක ගොඩනැගිලි 2 ක් 2021 වර්ෂයේ ඉදිකර තිබුණි. මීට අමතරව සමාලෝචිත වර්ෂයේ රු.230,000 ක මුදලක් වැයකර කොම්පෝස්ට් පෙරලන යන්ත්‍රයක් සහ කොම්පෝස්ට් හලන යන්ත්‍රයක් මිලදී ගෙන තිබූ අතර, එම යන්ත්‍ර මෙම ඉදිකරන ලද කොම්පෝස්ට් අංගනයේ ස්ථාපිත කිරීමට කටයුතු නොකර බී කලාපයට අයත් අරලගංවිල ගොවිපොලේ නිෂ්කාර්යව තබා තිබුණි. | හරිත කෘෂිකර්මාන්තය අරමුණු කරගෙන කාබනික පොහොර නිෂ්පාදනය සඳහා යන්ත්‍ර මිලදී ගැනීම 2021 වර්ෂයේ සිදුකළද, 2022 පළමු කාර්තුවේ අගභාගයේදී අදාළ යන්ත්‍ර මහවැලියට ලැබීම සිදුවිය. 2022 වසර මැද භාගයේදී රටේ උද්ගත වූ මූල්‍යමය අර්බුදය හමුවේ ප්‍රමාණවත් මුදල් නොමැතිවීම හා ඉන්ධන නොමැතිවීම මත ගොවිපල තුළ කොම්පෝස්ට් නිෂ්පාදනයට මෙම යන්ත්‍ර යොදා ගැනීම අපහසු විය. ජී කලාපයේ කොම්පෝස්ට් පොහොර නිෂ්පාදන අංගනය වෙත මෙම යන්ත්‍ර ලබාදීමට සැලසුම් කළද එම ක්‍රියාවලියද තාවකාලිකව අඩපණවී ඇති බැවින් ඉදිරියේදී වෙනත් ස්ථාන වෙත යන්ත්‍ර සූත්‍ර ස්ථානගත කර කොම්පෝස්ට් නිෂ්පාදනය කිරීමට සැලසුම් කර ඇත. | මනා සැලසුමකින් යුතුව ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම තුළින් අනාර්ථික වියදම් වළක්වා ගතයුතුය. ව්‍යාපෘති අරමුණු ඉටුකර ගැනීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගතයුතුය. |
| | (ii) | රු.11,270,000 ක් වැය කර මිලදී ගන්නා ලද විශාල හා කුඩා පරිමාණයේ බහුකාර්ය කැබලි කිරීමේ යන්ත්‍ර 23 ක් කොම්පෝස්ට් නිෂ්පාදන කටයුතු සඳහා යොදා නොගෙන ගවයින් සඳහා ලබා දෙන තෘණ කැබලි කිරීමට යොදවාගෙන තිබුණු අතර, රු.1,173,000 ක් වටිනා බහුකාර්ය කැබලි කිරීමේ යන්ත්‍ර 2 ක් පමණක් කලාපයට ලබාදී තිබුණි. | විශාල හා කුඩා පරිමාණයේ බහුකාර්ය කැබලි කිරීමේ යන්ත්‍ර 23 ක් 2021 වර්ෂයේ කාබනික පොහොර ප්‍රවර්ධන වැඩසටහන සඳහා මිලදී ගනු ලැබුවද, නැවත රසායනික පොහොර භාවිතය නිසා කාබනික පොහොර නිෂ්පාදනය මන්දගාමීවීම හේතුවෙන් මෙම යන්ත්‍ර කිරිගව පාලන කටයුතු සඳහා ආදේශනයක් ලෙස යොදා ගැනීමට කටයුතු කිරීම රටේ ආහාර සුරක්ෂිතතාවයට පිටිවහලක් විය. | මනා සැලසුමකින් යුතුව ව්‍යාපෘති ක්‍රියාත්මක කළ යුතු අතර ව්‍යාපෘති අරමුණු ඉටුකර ගැනීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගතයුතුය. |

| | | | |
|---|---|---|---|
| (ආ) | මහවැලි බී හා එල් කලාපවල ව්‍යාප්තවී ඇති උග්‍ර වකුගඩු රෝගයට පිළියමක් වශයෙන් ප්‍රමිතියෙන් යුත් ජල සැපයුමක් සහතික කිරීමේ අරමුණින් ප්‍රති ආශ්‍රැත ජල පිරිපහදු යන්ත්‍ර 30 ක් සැපයීම, ඉදිකිරීම, සවිකිරීම හා ඊට අනුශාංගික පහසුකම් සැපයීම සහ වසර 10 ක කාලයක් නඩත්තු කිරීම සඳහා 2015 වර්ෂයේදී අධිකාරිය, ජාතික ප්‍රජා ජල සැපයුම් දෙපාර්තමේන්තුව සමඟ ගිවිසුමක් ඇති කරගෙන තිබුණි. ඒ අනුව අධිකාරිය විසින් රු.80,000,000 වැය කර ස්ථාපිත කර තිබුණු යන්ත්‍ර 30 න් බී කලාපයේ යන්ත්‍ර 09 ක් හා එල් කලාපයේ යන්ත්‍ර 04 ක් වශයෙන් 13 ක් 2023 මැයි 01 දින වනවිට අක්‍රීය තත්ත්වයේ පැවතුණි. බී කලාපයේ යන්ත්‍ර ස්ථාපිත කිරීමේදී ස්ථානීය පරීක්ෂාවන් හා ඇගයීම් සිදුකර ස්ථාන තෝරා නොගැනීම හේතුවෙන් පිරිපහදු යන්ත්‍ර 05 ක් නිෂ්කාර්යව පැවතුණු අතර, යන්ත්‍ර 04 ක් සවිකිරීමෙන් පසු ක්‍රියාත්මක කර නොතිබුණි. එල් කලාපයේ අක්‍රීයව පැවති යන්ත්‍ර 02 ක් අක්‍රීය තත්ත්වයේම පැවතියදී 2023 මැයි 10 දින ගිවිසුම්ගතව ගොවි සංවිධාන වෙත පැවරීමට කටයුතු කර තිබුණි. ජාතික ප්‍රජා ජල සැපයුම් දෙපාර්තමේන්තුව සමඟ ඇති කරගත් ගිවිසුම ප්‍රකාරව ව්‍යාපෘතියේ අත්‍යාවශ්‍ය නඩත්තු කටයුතු, සේවා සැපයීම සහ අමතර කොටස් සපයා ගැනීමට අවශ්‍ය කළමනාකරණය හා අධීක්ෂණය සිදුකර නොතිබුණි. | බී කලාපයේ යන්ත්‍ර 09 ක් සහ එල් කලාපයේ යන්ත්‍ර 04 ක් වශයෙන් 13 ක් අක්‍රීය තත්ත්වයේ පවතී. යන්ත්‍ර 06 ක් ජාතික ප්‍රජා ජල සැපයුම් දෙපාර්තමේන්තුව මඟින් අලුත්වැඩියා කිරීමට අවශ්‍ය ටෙන්ඩර් ක්‍රියාවලිය මේ වනවිට සිදුවෙමින් පවතින බව 2023 ඔක්තෝබර් 06 වෙනි දින දැනුම්දී ඇත.<br>යන්ත්‍ර 3 ක් ගොවි සංවිධාන අරමුදලින් අලුත්වැඩියා කරන බව දැනුම්දී ඇත.<br>තවත් යන්ත්‍ර 4 ක් අලුත්වැඩියා කිරීමට ප්‍රජා ජල සැපයුම් දෙපාර්තමේන්තුව වෙත දැනුම්දී ඇත. | මෙවැනි ව්‍යාපෘති ඇරඹීමට පෙර ශක්‍යතා අධ්‍යයනයක් සිදුකර සුදුසුම ස්ථාන තෝරා ගැනීමට කටයුතු කළයුතුය.<br>අක්‍රීයව පවතින යන්ත්‍ර කඩිනමින් අලුත්වැඩියා කර ජනතාවට අවශ්‍ය පිරිපහදු ජලය ලබාදීමටත්, නිෂ්කාර්යව පවතින පිරිපහදු යන්ත්‍ර ඒවා අවශ්‍යම ස්ථානවල නැවත ස්ථාපනය කිරීමටත් කටයුතු කළයුතුය. |

### 3.7 ව්‍යාපෘති හෝ ප්‍රාග්ධන වැඩ ප්‍රමාදයන්

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | මහවැලි බී කලාපයට අයත් කන්දකාඩුව ප්‍රදේශයේ අක්කර 3770 ක භූමි ප්‍රදේශයක් කෘෂිකර්ම හා පශු සම්පත් සංවර්ධන ව්‍යාපෘතියක් ඇති කිරීම සඳහා අධිකාරිය විසින් තෝරාගෙන තිබුණි. මෙම | ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලය මඟින් කන්දකාඩු කෘෂිකර්ම ආයෝජන ව්‍යාපෘතියේ පරිසර බලපෑම් අධ්‍යයන වාර්තාව සකස් කිරීම (EIA අධ්‍යයන වාර්තාව) සිදුකර ඇතත්, එම උපදේශක සේවාවට අදාල ඉදිරි ගෙවීම් කිරීම | ව්‍යාපෘති ඇරඹීමට පෙර ශක්‍යතා අධ්‍යනයන් සිදු කළයුතුය. ආරම්භ කළ ව්‍යාපෘති නොපමාව නිම කර අපේක්ෂිත ප්‍රතිලාභ ලබා ගැනීමට කටයුතු කළයුතුය. |

| | | | |
|---|---|---|---|
| | ව්‍යාපෘතියට අදාළ පාරිසරික බලපෑම් ඇගයීමේ වාර්තා සකස් කිරීමේ කොන්ත්‍රාත්තුව ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලය වෙත රු.6,539,600 ක මුදලකට 2021 සැප්තැම්බර් 28 දින ප්‍රදානය කර තිබූ අතර, විගණිත දින වූ 2023 මැයි 23 වනවිට රු. 3,211,376 ක් විශ්ව විද්‍යාලය වෙත ගෙවා තිබුණි. 2022 මාර්තු 29 දිනැති අංක 22/0482/317/011 දරන අමාත්‍ය මණ්ඩල තීරණය අනුව සංවර්ධනය කිරීමට යෝජිත ඉඩමේ හිමිකම ජාතික පශු සම්පත් සංවර්ධන මණ්ඩලය වෙත පැවරීම හේතුවෙන් කොටසක් පමණක් නිමකර තිබූ පාරිසරික බලපෑම් ඇගයීම් වාර්තාවේ හිමිකම හා ඉදිරි ගෙවීම් වගකීම් සම්බන්ධයෙන් නිශ්චිත එකඟතාවයකට එළඹීමට 2023 මැයි 31 දක්වා අපොහොසත්වීම මත විශ්ව විද්‍යාලය අදාළ පාරිසරික ඇගයීම් වාර්තාව අවසන් කර නොතිබුණි. මේ හේතුවෙන් නිසි ශක්‍යතා අධ්‍යයනයකින් හා සැලසුමකින් තොරව ආරම්භ කරන ලද ව්‍යාපෘතිය වෙනුවෙන් විගණිත දින වනවිට වැය කරන ලද රු.3,211,376 ක මුදල නිෂ්කාර්ය වියදමක් බවට පත්වී තිබුණි. | ජාතික පශු සම්පත් සංවර්ධන මණ්ඩලය ප්‍රතික්ෂේප කරන බැවින් ගිවිසුම් ප්‍රකාරව පාරිසරික බලපෑම් ඇගයීමේ වාර්තාව අධිකාරියට ලබා ගැනීම සඳහා සහ ඉදිරියට කල යුතු ගෙවීම් සම්බන්ධයෙන් උපදෙස් හා අනුමැතිය ලබා ගැනීමට අමාත්‍ය මණ්ඩල සංදේශයක් සකස් කර අමාත්‍ය මණ්ඩල අනුමැතියට යොමු කර ඇත. | |
| (ආ) | අධිකාරිය විසින් කිරිගව පාලනයේ නියුතු ගොවීන්ට මහවැලි බී, සී, ඩී, එල් සහ උඩවලව කලාපවල තෘණ වගාව සඳහා අක්කර 2802 ක් පමණ ලබාදී සත්ත්ව පෝෂණය වැඩිදියුණු කිරීමේ වැඩසටහනක් ආරම්භ කර 2020 දෙසැම්බර් 31 දින වන විට නිම කිරීමට සැලසුම් කර තිබුණද, විගණිත දින වූ 2023 මැයි 31 දින වනවිටත් කිසිදු ඉඩමක් තෘණ වගාකරුවන් වෙත බෙදාදී නොතිබුණි. මෙහිදී එල් කලාපයේ යෝජිත තෘණ භූමි | මහවැලි බී, සී හා උඩවලව කලාප වල තෘණ භූමි ලෙස නිදහස් කිරීමට සුදුසු ඉඩම් කොටස් හඳුනා ගෙන අවසන් කර ඇත. උඩවලව කලාපයේ මයුරපුර කොට්ඨාසයේ තෘණ භූමි සඳහා වෙන් කර ඇති භූමි ප්‍රමාණයෙන් හෙක්ටයාර 735.36ක කොටසෙහි මී ගව අභිජනන ගොවිපල 15 ක් සඳහා අක්කර 75 ක් නිදහස් කිරීමට පරිසර අනුමැතිය හා එම ඉඩම් කොටස් බැහැර කිරීමට ජනාධිපතිතුමාගේ අවසරය ලබා ගැනීමට වාරිමාර්ග අමාත්‍යාංශයේ ලේකම්තුමාට යොමු කර ඇත. | ව්‍යාපෘති ඇරඹීමට පෙර ශක්‍යතා අධ්‍යයන සිදු කළයුතුය.<br>ආරම්භ කළ ව්‍යාපෘති කඩිනමින් නිම කර අපේක්ෂිත ප්‍රතිලාභ ලබාකර ගැනීමට කටයුතු කළයුතුය. |

| | | | |
|---|---|---|---|
| | වෙනුවෙන් මූලික පාරිසරික පරීක්ෂණයක් සිදුකිරීම සඳහා ශ්‍රී ලංකා රජරට විශ්ව විද්‍යාලයට රු.1,551,958 ක මුදලක්ද, පුරාවිද්‍යා ඇගයුම් සමීක්ෂණයක් සඳහා පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවට රු.140,099 ක මුදලක්ද, තෘණ වගා භූමිය මැනුම් කටයුතු වෙනුවෙන් ශ්‍රී ලංකා මිනින්දෝරු දෙපාර්තමේන්තුව වෙත රු.4,879,825 ක මුදලක්ද ලෙස එකතුව රු.6,545,882 ක් අධිකාරිය විසින් වැය කර තිබුණි. | 2022 වර්ෂයේ රට වසා තැබීම හේතුවෙන් මෙම කටයුතු යම් ප්‍රමාදයක් වුවත් යෝජිත භූමිය කිරිගව පාලන ගොවින්ට බෙදා දීමට 2022 ජූලි 21 දින ඉඩම් කච්චේරියක් පවත්වා පුද්ගලයින් 47 දෙනෙකු වෙත බැහැර කිරිමට මණ්ඩලය විසින් අනුමැතිය ලබා දෙන ලදී. 2022 නොවැම්බර් මස වන විට එල් කලාපයේ තෘණ භූමි කිරි ගොවින්ට නිදහස් කිරිමට අවශ්‍ය නීතිමය කටයුතු සම්පූර්ණ කර තිබුණද ජනාධිපති ලේකම්ගේ අංක PS/CSA/00/08 හා 2022 නොවැම්බර් 11 දිනැති ලිපිය අනුව අධිකාරියට අයත් රජයේ ඉඩම් බැහැර කිරීම තාවකාලිකව අත්හිටුවා ඇති බැවින් ව්‍යාපෘතියෙහි කටයුතු තාවකාලිකව නවතා ඇති බව දන්වා සිටිමි. | |
| (ඇ) | 2021 වර්ෂයේ සැලසුම් කර ක්‍රියාත්මක කරන ලද මහවැලි කලාප ආශ්‍රිත සමෘද්ධිලාභී කිරිගව පාලනයේ නියුතු ගොවීන්ගේ ගොවිපල සංවර්ධනය කිරීමේ ව්‍යාපෘතිය මූලිකව අධිකාරියේ සම්බන්ධීකරණයෙන්, සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුවේ ශ්‍රම දායකත්වයෙන්, සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුවේ ප්‍රතිපාදන යටතේ ක්‍රියාත්මක කිරීමට සැලසුම් කර තිබුණි. පසුව සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව ප්‍රතිපාදන ලබාදීම ප්‍රතික්ෂේප කිරීම හේතුවෙන් ව්‍යාපෘතිය ක්‍රියාත්මක කර නොතිබුණු අතර, ගව නිවාස 150 ක් හා ජල භාජන 150 ක් ඉදිකිරීම සඳහා 2021 නොවැම්බර් 30 දින අධිකාරියේ අධ්‍යක්ෂ (ධීවර හා පශු සම්පත් සංවර්ධන) වෙත නිදහස් කර තිබූ රු.1,425,000 ක අත්තිකාරම් මුදල අලාභයක් බවට පත්ව තිබුණි. විගණිත දින වූ 2023 මැයි 02 දින දක්වා අදාළ කාර්යය සම්පූර්ණ කර නොතිබුණු අතර, අත්තිකාරම් | කිරිගව පාලනයේ නියුතු ගොවීන්ගේ ගොවිපල සංවර්ධන කිරීමේ ව්‍යාපාතිය යටතේ සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුව වෙත ගව නිවාස 150 ක් හා ජල භාජන 150 ක් ඉදිකිරිමට අත්තිකාරම් නිදහස් කළ ද රට තුල දිනෙන් දින භාණ්ඩ මිල ඉහල යාම හේතුවෙන් එම මිලට ගව ගාල් සහ ආහාර භාජන ඉදි කිරිමට නොහැකි බව දන්වා ඇත.<br>ඒ අනුව පවතින සිමිත ප්‍රතිපාදන යටතේ ගව ගාල් 74 ක් ඉදි කරන ලෙස ඔවුන් වෙත දන්වන ලදී.<br>අත්තිකාරම් මුදල නිරවුල් කිරිම සඳහා ලබා දෙන ලද විස්තර ප්‍රමාණවත් නොවන බැවින් කඩිනමින් නිරවුල් වාර්තා ඉදිරිපත් කරන ලෙස එම ආයතනය දැනුවත් කර ඇත. | ව්‍යාපෘති ඇරඹීමට පෙර ශක්‍යතා අධ්‍යයන සිදු කළයුතුය.<br>ආරම්භ කළ ව්‍යාපෘති කඩිනමින් නිම කර අපේක්ෂිත ප්‍රතිලාභ ලඟාකර ගැනීමට කටයුතු කළයුතුය.<br>අත්තිකාරම් නිරවුල් කර ගැනීමට කටයුතු කළයුතුය. |

මුදල් පියවාද නොතිබුණි.

| | | | |
|---|---|---|---|
| (ඇ) | මහවැලි කලාපවල ගොවීන්ට ගුණාත්මක බීජ වී නිෂ්පාදනය කරදීමේ වැඩසටහනක් ආරම්භ කර 2021 හා 2022 වර්ෂවල අධිකාරිය සතු රත්කිඳ බීජ ගොවිපොල සඳහා රු.60,073,046 ක් වැයකර යන්ත්‍ර 15 ක් හා උපකරණ මිලදී ගෙන තිබුණි. මීට අමතරව රු.3,824,406 ක් වැයකර වී වේලීම සඳහා අලුතින් කමත් 3 ක් 2021 වර්ෂයේ ඉදිකර තිබුණි. වැඩසටහන ආරම්භ කර 2021 යල කන්නයේ සිට බීජ වී නිෂ්පාදනය කර එම බීජ භාවිතයෙන් වගා කන්න 4 ක් හෙක්ටයාර 196.25 ක්, 195.75 ක්, 152.75 ක් හා 100 ක් වශයෙන් වී වගා කර තිබුණි. කෙසේ වෙතත් ක්‍රමයෙන් වී වගා කරන ලද භූමි ප්‍රමාණය අඩුවී තිබූ අතර, 2023 යල කන්නයේ සිට බීජ වී නිෂ්පාදනය නතර කොට නැවතත් කලින් පැවති කන්න බදු ක්‍රමය යටතේ ගොවීන්ට ගොවිපොල සතු කුඹුරු ඉඩම් වගා කර ගැනීමට බදුදී තිබුණි. මේ හේතුවෙන් බීජ වී නිෂ්පාදනය සඳහා අධිකාරිය වැය කරන ලද රු.63,897,452 ක මුදලින් නිසි ප්‍රතිඵල ලබාගෙන නොතිබුණි. | 2021 වර්ෂයේදී රාජ්‍ය ප්‍රතිපත්ති මත කලාපීය ගොවි ප්‍රජාව සඳහා සහතික බීජ වී සපයාදීමේ අරමුණින් රත්කිඳ ගොවිපල වාරිබිම් හෙක්ටයාර් 196 ක වගා කටයුතු 2021 යල කන්නයේ සිට අධිකාරිය විසින් සිදු කරන ලදී.<br>කොවිඩ් වසංගත තත්වයෙන් පසු ඇතිවූ ආර්ථික අර්බුදය මත 2021/22 මහ කන්නයේදී රසායනික පොහොර හා කෘෂි යෙදවුම් ආනයනය සීමාකාරී වීමත්, 2022 යල කන්නයේදී රට දැඩි ඉන්ධන අර්බුදයකට මුහුණ පෑමට සිදුවීමෙන් බිම් සැකසීම් කටයුතු නිසි කලට සිදු කිරීමට නොහැකි වීමත්, 2022/23 මහ කන්නයේදී භාණ්ඩාගාර ප්‍රතිපාදන ලබා ගැනීම සීමාකාරී වීම හා අවශ්‍ය අවස්ථාවන්හිදී මූල්‍ය ප්‍රවාහය නිසි ලෙස නොලැබීම මත ඉතා සාර්ථකව සිදු කරනු ලැබූ බීජ වී නිෂ්පාදන වැඩසටහන සඳහා යොමු කල භූමිය ක්‍රමිකව අඩු කිරීමට සිදු විය.<br>2021 වර්ෂයේදී කෘෂිකර්ම රාජ්‍ය අමාත්‍යාංශය ලබාදුන් ප්‍රතිපාදන යොදාගනිමින් රත්කිඳ බීජ නිෂ්පාදන ගොවිපලෙහි බීජ වී නිෂ්පාදන වැඩසටහන සඳහා යන්ත්‍රෝපකරණ මිලදී ගැනීම, ගොවිපල යටිතල පහසුකම් නවීකරණය කිරීම හා කමත් 03ක් ඉදි කිරීම, විභව නිෂ්පාදනයක් සඳහා සෘජුව හා වක්‍රව දායක වේ. 2021/22 මහ කන්නයේ බීජ වී මෙ.ටො.403 ක් හා වාණිජ වී මෙට්‍රික් ටොන් 52 ක් නිෂ්පාදනයට මෙමගින් පිටිවහලක් වූ අතර, අලෙවියෙන් ලද මූල්‍ය වටිනාකම රු.මිලියන 72 ක් පමණ වේ. බීජ වී නිෂ්පාදනය සංකීර්ණ හා සූක්ෂම ක්‍රියාවලියකින් යුක්ත වන අතර, භූමිය සැකසීමේ සිට පසු අස්වනු හානි අවම කිරීම දක්වා වූ ක්‍රියාවලියේදී ලබාගත් උපකරණ හා පහසුකම් යොදවා ගන්නා ලදී. වර්තමානයේදී භාණ්ඩාගාර ප්‍රතිපාදන ලබා ගැනීමේ ගැටළු මත ගොවිපල බීජ වී නිෂ්පාදනය සිදුකල | ව්‍යාපෘති ඇරඹීමට පෙර ශක්‍යතා අධ්‍යයනයක් සිදු කළයුතුය.<br>ව්‍යාපෘතිය නැවත ක්‍රියාත්මක කිරීමේ හැකියාව සලකා බලා එමගින් එහි අරමුණු ලඟා කරගැනීමට කටයුතු කළයුතුය. |

| | | | |
|---|---|---|---|
| | | නොහැකි බැවින් අමාත්‍ය මණ්ඩල අනුමැතියට අනුව පුද්ගලික ආයෝජකයන් සම්බන්ධ කර ගන්නා තෙක් වෙන්දේසි ක්‍රමවේදයට අනුව කන්න බදු දීම සිදු කලයුතුවේ.<br>ඒ අනුව උක්ත මුදල නිෂ්කාර්ය වියදමක් නොව ආයෝජනයක් ලෙස සැලකිය හැක. | |
| (ඉ) | අධිකාරිය විසින් කුඩා පරිමාණ ජලවිදුලි බලාගාර ඉදිකිරීමට ආයෝජකයින් තෝරා ගැනීම සහ ඊට සුදුසු ස්ථාන 20 ක් හඳුනා ගැනීමට 2011 වර්ෂයේ සිට 2013 වර්ෂය දක්වා රු.1,297,533 ක් වැයකර තිබුණද, ඉන් ව්‍යාපෘති 10 ක් විගණිත දින එනම් 2023 අප්‍රේල් 28 දින දක්වා අවසන් කිරීමට නොහැකිවී තිබුණි. | කුඩා පරිමාණ ජල විදුලි ව්‍යාපෘති ආයෝජකයන් විසින් 2021 වර්ෂයේදී ඉදිරිපත් කරන ලද ඉල්ලීම් සලකා බලා එවක සිටි ජනාධිපති ලේකම්වරයා "ජල පෝෂක ප්‍රදේශ කළමනාකරණ ගාස්තුව" අයකිරීම අත්හිටුවන ලෙස ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය හා අදාල අනෙකුත් ආයතන වෙත උපදෙස් ලබාදී තිබුනි. ඒ අනුව එම තීරණය ලබා දුන් 2021 නොවැම්බර් මස සිට අදාල ජල පෝෂක ප්‍රදේශ කළමනාකරණ ගාස්තුව අධිකාරිය වෙත නොලැබී ඇත.<br>එසේ වුවද 2022 ජූනි මාසයේදී ජනාධිපති ලේකම්වරයාගේ උපදෙස් අනුව 2022 ජූනි මස සිට ජල පෝෂක ප්‍රදේශ කළමනාකරණ ගාස්තුව ලැබිය යුතු වුවද ඒ වනවිට ලංකා විදුලි බල මණ්ඩලය මුහුණ දී සිටි මූල්‍ය අර්බුදය හේතුවෙන් විදුලිය සඳහා ගෙවීම් නොකල අතර අධිකාරිය වෙතද ලැබිය යුතු ජල පෝෂක ප්‍රදේශ කළමනාකරණ ගාස්තුව නොලැබුණි. නමුත් අදාල ජල පෝෂක ප්‍රදේශ කළමනාකරණ ගාස්තුව 2023 ජූලි මස සිට ලැබෙමින් පවතී.<br>කෙසේ වුවද 2021 නොවැම්බර් මස සිට 2022 ජූනි මාසය දක්වා කාල පරිච්ඡේදය සඳහා ජල පෝෂක ප්‍රදේශ කළමනාකරණ ගාස්තුව අයකර ගැනීමට හැකියාවක් නොමැත. | කළමනාකරණයේ අදහස් දැක්වීම නිරීක්ෂණය හා නොගැලපේ.ව්‍යාපෘති ඇරඹීමට පෙර ශක්‍යතා අධ්‍යයන සිදු කළයුතුය.<br>ආයෝජකයින් හා සුදුසු ස්ථාන හඳුනා ගැනීමේ කාර්ය සිදුකර නිම කිරීමට කටයුතු කළයුතුය. |
| (ඊ) | 2022 වර්ෂය තුළ වාරි සෞභාග්‍යා වැඩසටහන යටතේ වැව් 54 ක් ප්‍රතිසංස්කරණය කිරීමට සැලසුම් කර වාර්ෂික අයවැයෙන් රු.මිලියන 80 ක් වෙන්කර | වාරි සෞභාග්‍යා වැඩසටහන යටතේ අත්‍යාවශ්‍යම කල යුතු වැඩ අනුව තෝරාගත් වැව් 275 න් 152 ක වැඩ අවසන් කර ඇත. වැව් 67 ක කිසිදු ප්‍රතිසංස්කරණ කටයුත්තක් කර | ශක්‍යතා අධ්‍යයන මගින් ප්‍රමුඛතා පදනමක් මත ඉටු කළයුතු කාර්යයන් හඳුනාගෙන ව්‍යාපෘති සැලසුම් කළයුතුය. |

| | | | |
|---|---|---|---|
| | තිබුණි. 2022 දෙසැම්බර් 31 දිනට මෙම වැඩසටහනේ මූල්‍ය ප්‍රගතිය රු.මිලියන 81.4 ක් වූ අතර, වැව් 32 ක් පමණක් පිළිසකර කර තිබුණි. ඒ අනුව මූල්‍ය ප්‍රගතිය සියයට 102 ක් පමණ වන විට භෞතික ප්‍රගතිය සියයට 59 ක් විය. | නැත. ඉතිරි වැව් 56 ක වැඩ අවසන් කර නොමැත. | සැලසුම් ප්‍රකාරව කඩිනමින් වැඩ නිම කිරීමට කටයුතු කළයුතුය. |
| (උ) | රඹකැන්ඔය කලාපයේ පොල්ලේබැද්ද කොට්ඨාශයේ නිල නිවාස ඉදිකිරීමට අදාළ කොන්ත්‍රාත්තුව 2017 නොවැම්බර් 23 දින රු.4,861,103 කට ප්‍රදානය කර තිබුණි. 2018 අප්‍රේල් 24 දින එහි වැඩ නිම කළයුතු වූවත්, විගණිත දිනය වූ 2023 අප්‍රේල් 28 වනවිටත් කොන්ත්‍රාත්තුව නිම නොකර ඉදිකිරීම් වැඩ අතහැර දමා තිබුණි. කොන්ත්‍රාත්කරුට ගෙවූ රු.1,417,556 ක සංචලන අත්තිකාරම් මුදල අයකර ගැනීමට හා කොන්ත්‍රාත්කරුට විරුද්ධව නීතිමය පියවර ගැනීමට කටයුතු කර නොතිබුණි. | රඹකැන්ඔය කලාපයේ පොල්ලේබැද්ද කොට්ඨාශයේ නිල නිවාස ඉදි කිරීමට අදාළ කොන්ත්‍රාත්තුව 2017 නොවැම්බර් 23 දින රු.4,861,103කට කොන්ත්‍රාත්කරුවකු වෙත ප්‍රදානය කර ඇත. 2018 අප්‍රේල් 18 දිනට වැඩ අවසන් කළ යුතු වුවත් කොන්ත්‍රාත්කරු කොන්ත්‍රාත්තුව අතහැර දමා ගොස් ඇති බැවින්, ගෙවා ඇති සංචලන අත්තිකාරම් මුදල වන රු.1,243,051 අයකර ගැනීම සඳහා නීතිපති විමසා ලබාදුන් නිරීක්ෂණ පාදක කොට ගෙන නීති අංශය මගින් ඉදිරි කටයුතු ක්‍රියාත්මක කරමින් පවතී. එම කොන්ත්‍රාත්තුවේ ඉතිරි වැඩ අංක DDG/TS/CON/RAMBA/B/14 කොන්ත්‍රාත්තුව යටතේ ඉදිකර භාවිතයට ගැනීමට කටයුතු කර ඇත. | ගිවිසුම් ප්‍රකාරව වැඩ නිම නොකළ කොන්ත්‍රාත්කරුට එරෙහිව නෛතික ක්‍රියාමාර්ග ගැනීමට හා සිදුවූ අලාභය අයකර ගැනීමට කටයුතු කළයුතුය. |
| (ඌ) | දක්ෂිණ අධිවේගී මාර්ගයේ මාතර සිට හම්බන්තොට දක්වා වූ කොටසේ ඉදිකිරීම හේතුවෙන් අධිකාරියේ වලව විශේෂ බලප්‍රදේශයට අයත් අඟුණුකොලපැලැස්ස හා මුරවැසිහේන කොට්ඨාශවලට අයත් බෙදුම් ඇලවල් ආශ්‍රිත නිර්මිතයන්ට සිදුවූ හානි පුනරුත්ථාපනය වෙනුවෙන් අධිකාරිය විසින් 2021 මාර්තු 04 දින ව්‍යාපෘති 10 ක් සඳහා රු.43,883,862 ක ඇස්තමේන්තුවක් සකස් කර මාර්ග සංවර්ධන අධිකාරිය යටතේ වූ අදාළ ඉදිකිරීම් ව්‍යාපෘතිය වෙත දැනුම්දී තිබුණි. ඒ අනුව එම ඇස්තමේන්තු මුදල වූ රු.43,883,862 මාර්ග | මේ සඳහා රු.43,883,862 ක මුදලක් මාර්ග සංවර්ධන අධිකාරියෙන් වලව කලාපයට ලැබී තිබුණි. වාරි ඇලවල් ඇතුලු නිර්මිතයන්ට සිදු වූ හානි යථා තත්වයට පත් කිරීමට ව්‍යාපෘති 10 ක් සඳහා සකස් කරන ලද ඇස්තමේන්තුවෙන් ව්‍යාපෘති 08ක් සඳහා වැඩ අනුමැතිය ලැබී ප්‍රසම්පාදන කටයුතු ද ආරම්භ කර ඇති බව දන්වමි. | හානි වූ වාරි නිර්මිතයන් අලුත්වැඩියා කිරීම සඳහා ප්‍රසම්පාදන ක්‍රියාවලිය හරහා කොන්ත්‍රාත්කරුවන් තෝරාගෙන පුනරුත්ථාපන කටයුතු ආරම්භ කළයුතුය. |

සංවර්ධන අධිකාරිය විසින් 2021 මාර්තු 10 දින වලව කලාපයේ තැන්පත් කර තිබුණද, විගණිත දින වූ 2023 අප්‍රේල් 28 දින දක්වා මෙම ඇලවල්වල පුනරුත්ථාපන කටයුතු ආරම්භ කර නොතිබුණු අතර, අදාළ මුදල නිෂ්කාර්යව තබා තිබුණි.

## 3.8 කොන්ත්‍රාත් පරිපාලනයේ අඩුපාඩු

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | බකමූණ බස් නැවතුම් පොළවල් ඉදිකිරීමේ කොන්ත්‍රාත්, ප්‍රසම්පාදන ක්‍රියාවලියෙන් බැහැරව ඉංජිනේරුමය කාර්යයන් පිළිබඳ මධ්‍යම උපදේශක කාර්යාංශයට පිරිනැමීමට 2021 අගෝස්තු 24 දිනැති අංක අමප/21/1396/317/039 දරන අමාත්‍ය මණ්ඩල තීරණයෙන් අනුමැතිය ලබාදී තිබුණි. එහිදී මුදල් අමාත්‍යවරයාගේ නිර්දේශ පිළිබඳව සලකා බලන ලෙස අමාත්‍ය මණ්ඩලය නියම කර තිබුණු අතර, රජය සතු ඉදිකිරීම් ආයතන සීමිත තරඟකාරී ලංසු ක්‍රියාවලිය යටතේ සලකා බැලීමට මුදල් අමාත්‍යවරයා නිර්දේශ කර තිබුණි. එසේ වුවද, ඒ පිළිබඳ සැලකිලිමත් නොවී උක්ත ආයතනයට සෘජුවම කොන්ත්‍රාත්තුව පිරිනමා තිබුණි. කොන්ත්‍රාත් ගිවිසුම අනුව බකමූණ බස් නැවතුම්පොල ඉදිකිරීම 2022 අප්‍රේල් 04 දින නිම කළයුතු වුවත්, විගණිත දිනය වූ 2023 අප්‍රේල් 28 දින වනවිට ඉදිකිරීම් අවසන් නොකර අත්හැර දමා තිබුණි. වැඩපූර්ව අත්තිකාරම් ලෙස 2021 දෙසැම්බර් 06 හා 2022 මාර්තු 28 දිනවල ගෙවා තිබුණු එකතුව රු.මිලියන 13 ක් ද අධිකාරියට අයකර ගැනීමට නොහැකිවී තිබුණු අතර, 2022 අගෝස්තු 31 දින ගෙවා තිබුණු රු.6,238,208 ක සහතික කළ වැඩ වටිනාකමද ඇතුළු සමස්ථ ගෙවීම රු.19,238,208 ක් වී තිබුණි. | බකමූණ නගරයේ මහජන බස්නැවතුම්පල ඉදිකිරීමේ කොන්ත්‍රාත්තුව ඉංජිනේරුමය කාර්යයන් පිළිබඳ මධ්‍යම උපදේශන කාර්යංශයට පිරිනැමීම සිදු කලේ එම කොන්ත්‍රාත්තුව සඳහා 2021 අගෝස්තු 24 දිනැති අංක අමප 21/1396/317/039 දරණ අමාත්‍ය මණ්ඩල තීරණය මත වේ. තවද මෙම කොන්ත්‍රාත්තුව, ඉදිකිරීම් අමුද්‍රව්‍ය මිල ගණන් වල සිදු වූ සීඝ්‍ර වර්ධනය හා රට තුල ඇති වූ ආර්ථික අර්බුදය හමුවේ මුදල් ප්‍රතිපාදන නොමැති වීමෙන් දෙපාර්ශවයේ එකඟතාවය මත 2023 මැයි 12 දින අවලංගු කර ඇත.<br>මෙම අවලංගු කිරීම සිදු කලේ එමගින් කිසිදු හානියක් රටේ මහජනතාවට හෝ පරිසරයට සිදු නොවන ලෙස වන අතර ඉදිරි වැඩ කටයුතු සඳහා මුදල් ප්‍රතිපාදන වෙන් වූ පසු කොන්ත්‍රාත්තුවේ ඉදිරි වැඩ කටයුතු නිම කිරීමට බලාපොරොත්තු වේ.<br>ඉහත වැඩපූර්ව අත්තිකාරම් නිරවුල් වනතෙක් ඉංජිනේරුමය කාර්යයන් පිළිබඳ මධ්‍යම උපදේශක කාර්යාංශයට ගෙවීමට ඇති වෙනත් කාර්යයක් සඳහා වූ රුපියල් මිලියන 13 ඉක්ම වූ ගෙවීම් තාවකාලිකව අත්හිටුවා ඇත. | සෑම විටම ප්‍රසම්පාදන මාර්ගෝපදේශ ප්‍රකාරව තරඟකාරී ප්‍රසම්පාදන ක්‍රම අනුගමනය කළයුතුය. ගෙවීම් කළ මුදල ආවරණය කරගැනීමට හා සැලසුම් කළ කාර්ය නිම කිරීමට කටයුතු කළයුතුය. |

| | | | |
|---|---|---|---|
| (ආ) | මහඔය කලාපයේ නිල නිවාසයක් ඉදිකිරීම සඳහා 2017 නොවැම්බර් 14 දින රු.4,843,183 කට කොන්ත්‍රාත්තුවක් ප්‍රදානය කර තිබූ අතර, එහිදී රු.1,422,931 ක සංචලන අත්තිකාරම් ගෙවා තිබුණි. ගිවිසුමට අනුව 2018 මැයි 06 දින වැඩ නිම කළයුතු වුවත්, විගණිත දිනය වූ 2023 මාර්තු 28 දින වනවිටත් කොන්ත්‍රාත්තුව නිම නොකර අදාළ ඉදිකිරීම් වැඩ අතහැර දමා තිබුණි.<br><br>එම කොන්ත්‍රාත්තුව නියමිත දිනට ඉටුකර නොතිබියදී රත්කිඳ සංචාරක බංගලාව අලුත්වැඩියාවට අදාළ කොන්ත්‍රාත්තුව 2018 දෙසැම්බර් 24 දින රු.12,107,000 ක මුදලකට උක්ත කොන්ත්‍රාත්කරුටම ප්‍රදානය කර කොන්ත්‍රාත්කරු වෙත රු.3,447,508ක සංචලන අත්තිකාරම් ගෙවා තිබුණි. කොන්ත්‍රාත් ගිවිසුම අනුව 2019 ජූලි 19 දින වනවිට වැඩ නිම කළයුතු වුවත්, විගණිත දිනය වූ 2023 අගෝස්තු 16 වනවිට වැඩ නිම නොකර එම කොන්ත්‍රාත්තුවද අතහැර දමා තිබුණි. නියෝජ්‍ය අධ්‍යක්ෂ (නීති)ගේ අංක MA/LO/1.4.2 හා 2022 ඔක්තෝබර් 03 දිනැති ලිපිය ප්‍රකාරව අත්තිකාරම් මුදල කොන්ත්‍රාත්කරු වෙත ලබාදෙන අවස්ථාවේදී ලබාගෙන ඇති බැංකු ඇපකරයේ කොන්ත්‍රාත්කරු වෙත කරනු ලබන සියලු ගෙවීම් ඉදිකිරීම් ආරක්ෂණ අරමුදල් ගිණුමක තැන්පත් කරන ලෙසට කොන්දේසියක් දක්වා තිබුණද, ඊට පටහැනිව අධිකාරිය විසින් අදාළ ගෙවීම් කොන්ත්‍රාත්කරුට ගෙවා තිබීම හේතුවෙන් හා බැංකු ඇපකරයේ කාලය ඉක්මවා ඇති බැවින් එමගින් හානි පූරණය කරගැනීමට අධිකාරියට නොහැකිවී තිබුණි. මේ වනවිට කොන්ත්‍රාත්තුව ආරම්භ කර වසර 4 ක් ගතවී ඇති අතර, සංචාරක බංගලාවේ වහලය | රඹකැන්ඔය කලාපයේ මහඔය කඳවුරු පරිශ්‍රයේ IV ශ්‍රේණියේ නිල නිවාසයක් ඉදි කිරීම සඳහා කොන්ත්‍රාත් අංක MA/TS/RIDE/B/57 යටතේ 2017 නොවැම්බර් 14 දින රු.4,843,183 ක මුදලකට කොන්ත්‍රාත්තුව ප්‍රදානය කර ඇත. කොන්ත්‍රාත්තුව 2018 මැයි 06 දිනට අවසන් කළ යුතුව පැවතුන අතර ඒ සඳහා රු. 1,414,556 ක සංචලන අත්තිකාරම් ගෙවා ඇතත්, කොන්ත්‍රාත්කරු විසින් එය අතහැර දමා ඇත. ගෙවා ඇති සංචලන අත්තිකාරම් අය කර ගැනීම සඳහා නීතිපති නීරීක්ෂණ පාදක කොට ගෙන අධිකාරියේ නීති අංශය ඉදිරි කටයුතු ක්‍රියාත්මක කරමින් පවතී.<br>ඉදිරියේදී මුදල් වෙන්වූ පසු ඉතිරි ඉදිකිරීම් සිදුකිරීමට බලාපොරොත්තු වේ. | නිල නිවාස හා සංචාරක බංගලාව ඉදි කිරීමේ කාර්යය අතහැර දැමූ කොන්ත්‍රාත්කරුට එරෙහිව නෛතික ක්‍රියාමාර්ග ගැනීමටත්, අධිකාරියට සිදුවූ පාඩුව අයකර ගැනීමටත්, නිලධාරීන් වගකීම් විරහිතව ක්‍රියාකර ඇත්නම් විනය ක්‍රියාමාර්ග ගැනීමටත්, නිම නොකරන ලද වැඩ කොටස් පරීක්ෂා කර ඒවා නිම කිරීමටත්, අවශ්‍ය පියවර ගතයුතුය. |

| | | | |
|---|---|---|---|
| | ඉවත් කර තිබීම හේතුවෙන් එම ගොඩනැගිල්ල තවදුරටත් හානිවී තිබුණි. | | |
| (ඇ) | අධිකාරිය විසින් තම්මැන්නාව වැව ආශ්‍රිතව ආර්ථික මධ්‍යස්ථානයක් රු.6,514,819 කට ඉදිකිරීම සඳහා ප්‍රසම්පාදන මාර්ගෝපදේශවලින් බැහැරව අමාත්‍ය මණ්ඩල අනුමැතිය මත ඉංජිනේරුමය කාර්යයන් පිළිබඳ මධ්‍යම උපදේශක කාර්යාංශය සමඟ 2021 ඔක්තෝබර් 12 දින ගිවිසුම්ගතව තිබුණි. ගිවිසුම් ප්‍රකාරව අදාළ ඉදිකිරීම් කාර්යය දින 60 ක් තුළ නිම කළයුතු වුවත්, ඒ අවස්ථාව වනවිටද ඉදිකිරීම් භූමිය නිරවුල්ව නිදහස් කරදී නොතිබුණු අතර ගිවිසුමට එළඹීමටද පෙර 2021 අගෝස්තු 23 දින රු.2,062,201 ක සංචලන අත්තිකාරම් මුදලක් කාර්යාංශය වෙත නිදහස් කර තිබුණි. 2023 අප්‍රේල් 28 දින අදාළ කොන්ත්‍රාත්තුව අත්හිටුවා තිබුණු අතර, විගණිත දින වූ 2023 අප්‍රේල් 28 වන විට සංචලන අත්තිකාරම නිකුත් කර වසර 2 කට ආසන්න කාලයක් ගතවී තිබුණද එය ආපසු අයකර ගැනීමට හෝ එම කොන්ත්‍රාත්තුව සම්බන්ධව ඉදිරි ක්‍රියාමාර්ග ගැනීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. | ඉහත කොන්ත්‍රාත්තුව 2021 ජුනි 14 දිනැති අංක 21/0967/317/026 දරණ අමාත්‍ය මණ්ඩල අනුමැතියට යටත්ව CECB ආයතනයට සෘජු කොන්ත්‍රාත්තුවක් ලෙස ප්‍රසම්පාදන මාර්ගෝපදේශ 2.14.1 (Supplementary 35) අනුව සහ අමාත්‍යාංශ ප්‍රසම්පාදන කමිටු අනුමැතිය සහිතව පිරිනමා ඇත.<br>අදාළ ඉදිකිරීම සිදුකිරීමට අදාල ඉඩම මාර්ග සංවර්ධන අධිකාරියේ රක්ෂිත සීමාවට අයත්ව තිබූ බැවින් එම අධිකාරිය ඉදිකිරීමට අවසර ලබා නොදීම නිසා ඉහත කොන්ත්‍රාත්තුව 2023 අප්‍රේල් 28 දින අන්‍යෝන්‍ය එකඟතාව මත ආහෝසි කිරීමට කටයුතු කර ඇත.<br>තවද මෙම ඉදිකිරීම වෙනුවෙන් අදාල කොන්ත්‍රාත් සමාගමට ලබාදෙන ලද සංචලන අත්තිකාරම් මුදල වන රු.2,062,201 ක මුදල එම කොන්ත්‍රාත් සමාගමට අධිකාරිය විසින් ගෙවිය යුතු හෙල බොජුන් හල ඉදි කිරීමේ බිල් පතින් අඩුකර ගැනීමට කටයුතු කරන බව දන්වා සිටිමි. | මෙවැනි ව්‍යාපෘති ආරම්භ කිරීමට ප්‍රථම මූලිකව ඉටුකල යුතු නිරවුල් කිරීම් සිදුකිරීම, භූමිය හා අනෙකුත් අවශ්‍ය සම්පත් ලබා ගැනීමේ හා අවසරයන් ලබාගැනීමේ හැකියාව තහවුරු කරගැනීම හා සැලසුම් කිරීම සඳහා අවශ්‍ය පියවර ගතයුතුය. ලබාදී ඇති සංචලන අත්තිකාරම් මුදල වහාම අයකර ගතයුතු අතර, ගිවිසුමට එළඹීමට පෙර අත්තිකාරම් ගෙවීමට කටයුතු කළ නිලධාරීන්ට එරෙහිව විනයානුකූල පියවර ගතයුතුය. |
| (ඈ) | මධ්‍යම පරිසර අධිකාරියේ, මධ්‍යම පළාත් කාර්යාලය ලෙස භාවිතා කරනු ලැබූ පොල්ගොල්ල වේල්ල අසල පිහිටි ගොඩනැගිල්ල මහවැලි අධිකාරිය වෙත පවරා ගෙන මධ්‍යම පරිසර අධිකාරියට අයත් කුණ්ඩසාලේ වරාපිටිය ප්‍රදේශයේ ඉඩමක නව ගොඩනැගිල්ලක් ඉදිකර දීම සඳහා මහවැලි අධිකාරිය විසින් රු.32,096,839 ක කොන්ත්‍රාත්තුවක් ඉංජිනේරුමය කාර්යයන් පිළිබඳ මධ්‍යම උපදේශක කාර්යාංශය වෙත ගිවිසුම්වලට එළඹීමෙන් තොරව ප්‍රදානය කර තිබුණි. කෙසේ | මධ්‍යම පරිසර අධිකාරියේ මධ්‍යම පළාත් කාර්යාලය පවත්වාගෙන යාම සඳහා කුණ්ඩසාල ප්‍රාදේශීය ලේකම් බල ප්‍රදේශයේ පිහිටි පැරණි ගොඩනැගිලි සහිත වරාපිටිය ඉඩම පවරා ගැනීම සහ නව ගොඩනැගිලි ඉදිකිරීම සඳහා මහවැලි සංවර්ධන හා පරිසර අමාත්‍යතුමා ඉදිරිපත් කළ 2016 අගෝස්තු 30 දිනැති අංක 16/1857/704/052 දරන අමාත්‍ය මණ්ඩල සංදේශයට ලබා දුන් තීරණයට අනුව යෝජිත නව ගොඩනැගිල්ලේ පළමු අදියර ඉදිකිරීමේ කොන්ත්‍රාත්තුව ඉංජිනේරුමය කාර්යයන් පිළිබඳ | කොන්ත්‍රාත් ප්‍රදානය කිරීමට පෙර නිසි සැලසුම්කරණයක් හා වැඩ අධීක්ෂණයක් සිදුකළයුතුය. සෑම විටම ප්‍රසම්පාදන මාර්ගෝපදේශ අනුගමනය කර කොන්ත්‍රාත්කරු තෝරා ගතයුතුය. අදාළ ගොඩනැගිල්ලේ ඉදිකිරීම් නිම කර පරිසර අධිකාරිය වෙත පවරා දීමට |

| | | | |
|---|---|---|---|
| | වෙතත් ප්‍රතිපාදන ප්‍රමාණවත් නොවීම මත විගණිත දිනය වූ 2023 අප්‍රේල් 28 වනවිට එකහවූ පරිදි මහල් 04 කින් යුක්ත වූ ගොඩනැගිල්ල ඉදිකර නොතිබුණු අතර, බිම් මහල පමණක් ඉදිකර තිබුණි. එයද නිසි නිමාවකින් තොරව අසම්පූර්ණ ලෙස අවසන් කර තිබීම හේතුවෙන් මධ්‍යම පරිසර අධිකාරිය අදාළ ගොඩනැගිල්ල විගණිත දින දක්වා භාරගෙන නොතිබුණි. | මධ්‍යම උපදේශක කාර්යාංශය වෙත සැලසුම් කර ඉදිකර භාරදීමේ (Trunkey) පදනම මත පිරිනැමීමට අනුමැතිය ලැබී ඇත. මේ සඳහා රු.32,096,839 ක ඇස්තමේන්තුව පළමු අදියර වශයෙන් බිම් මහලේ ස්ලැබ් (Slab Level) මට්ටම දක්වා ඉදිකිරීම සඳහා පමණක් ඉදිරිපත් කර ඇත. ඉදිරියේ දී මධ්‍යම පරිසර අධිකාරිය වෙත ප්‍රතිපාදන ලැබීමෙන් පසු ඉදිකිරීම් කඩිනමින් අවසන්කර එම කාර්යාලයේ කටයුතු ආරම්භ කිරීමට අපේක්ෂිත බව එම අධිකාරිය දන්වා ඇත. | කටයුතු කළයුතුය. |
| (ඉ) | අධ්‍යක්ෂ ජනරාල්ගේ 2022 ජුනි 29 දිනැති අංක MASL/DG/පොදු/01 දරන ලිපිය අනුව මහවැලි කලාපවල හා ව්‍යාපෘතිවල අත්‍යාවශ්‍ය හා කාලීන අවශ්‍යතා එනම් ජලාශ පද්ධති නඩත්තුව, ගොවිපලවල්වල ශ්‍රම අවශ්‍යතාවය, සනීපාරක්ෂක කටයුතු හා කඳවුරු නඩත්තුව යන කාර්යයන් ඉටුකර ගැනීම සඳහා ගොවි සංවිධාන මට්ටමින් ශ්‍රමිකයන් බඳවා ගතයුතු විය. තවද, අධ්‍යක්ෂ ජනරාල්ගේ 2019 පෙබරවාරි 01 දිනැති අංක DG/3/2019 දරන චක්‍රලේඛය ප්‍රකාරව වටිනාකම රු.5,000,000 දක්වා වූ සුළු ප්‍රතිසංස්කරණවලට අදාළ වැඩ සුදුසුකම් සහිත මහවැලි ගොවි සංවිධානවලට සෘජුව ප්‍රදානය කළහැකි වුවද, සමාලෝචිත වර්ෂයේ සී කලාපය විසින් සිදුකර තිබූ නඩත්තු කාර්යයන්ට අදාළ වටිනාකම් එකතුව රු.46,045,718 ක් වූ සුළු පරිමාණ කොන්ත්‍රාත් (ශ්‍රම කොන්ත්‍රාත්) 59 ක් සහ එකතුව රු. 9,281,309 ක් වූ ඉදිකිරීම් කොන්ත්‍රාත් 05 ක් පුද්ගලික කොන්ත්‍රාත්කරුවන් වෙත ප්‍රදානය කර තිබුණි. | වර්ෂය මුලදී සිදු කළයුතු කාර්යන් ඇස්තමේන්තු කර වර්ෂය ආරම්භයේ කාර්යන් සඳහා ලබා දිය හැකි අවම ශ්‍රම දිනයක මිල කැඳවා ඒ අනුව කොන්ත්‍රාත්තුව ලබා දීම සිදු කරයි. ගොවි සංවිධානය මඟින් මෙම කාර්යය සිදු කිරීමේදී අදාල බල ප්‍රදේශයට අයත් මූල්‍ය තාක්‍ෂණික හා කළමනාකරණ හැකියාව සපුරන ගොවි සංවිධාන අවම වීම, කම්කරු කාර්යාලයේ නීතිරීතිවලට යටත්ව ලියාපදිංචි කළ ගොවි සංවිධාන සොයා ගැනීමේ අපහසුව, ශ්‍රමික අවශ්‍යතා වලට සරිලන විශේෂිකරණයට ලක්වූ ශ්‍රමිකයන් නොමැති වීම, ජල පාලන කටයුතුවලදී පුද්ගල පක්‍ෂපාති බවට කටයුතු කිරීම නිසා ජල කළමනාකරණයට බාධා වීම, ගොවි සංවිධාන පදනමෙන් ලබා ගන්නා ශ්‍රමිකයන් පසුකාලීනව සේවක අයිතිවාසිකම් ඉල්ලීම, වාර්ෂිකව ගොවි සංවිධාන නිළධාරින් වෙනස් වීම මත වගකීම් පැහැර හැරීම වැනි අවාසි සිදුවේ.<br><br>ගොවි සංවිධාන මඟින් කම්කරුවෙකු ලබා ගැනීමේදී නුපුහුණු කම්කරුවෙකුට අවම වශයෙන් රු.2,000 ක් ද, සනීපාරක්ෂකයෙකු සඳහා රු.3,000 ක් ද, 5% ක අතිරේක මුදලක් ද ගොවි සංවිධානයට ගෙවිය යුතුයි. නමුත් විවෘත මිල කැඳවීම යටතේ | අධ්‍යක්ෂ ජනරාල්ගේ 2022 ජුනි 29 දිනැති අංක MASL/DG/පොදු/01 දරන ලිපිය අනුව ගොවි සංවිධාන මට්ටමින් ශ්‍රමිකයන් බඳවා ගැනීමට කටයුතු කළයුතුයි. |

| | | |
|---|---|---|
| | | වසරතුලම ශ්‍රම ඒකකයකට වැයවන්නේ රු. 1,466 ක් පමණකි. එබැවින් ඉහත කරුණු සළකා බලා කොන්ත්‍රාත් පදනම මත මෙම කාර්යයන් සිදුකර ඇත. | |

### 3.9 මානව සම්පත් කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සමාලෝචිත වර්ෂය අවසානයට අධිකාරියේ ජ්‍යෙෂ්ඨ කළමනාකරණ මට්ටමේ තනතුරු 34 ක් පැවතුණු අතර, ඉන් තනතුරු 15 ක් පුරප්පාඩුව පැවතුණි. ඉන් තනතුරු 12 ක් සඳහා වැඩබැලීම, රාජකාරී ඉටුකිරීම/ රාජකාරී ආවරණය හා කොන්ත්‍රාත් පදනම මත රාජකාරී ඉටුකරමින් පවතී. අනුමත කාර්ය මණ්ඩලයේ ඇතුළත් නොවුණු තනතුරු 10 ක් සඳහා ස්ථිරව 13 ක් ද, කොන්ත්‍රාත් පදනමින් 32 ක් ද, වශයෙන් නිලධාරීන් 45 ක් බඳවාගෙන තිබුණි. ප්‍රාථමික ශ්‍රේණියේ තනතුරු 04 ක් සඳහා අනුමත කාර්ය මණ්ඩලය ඉක්මවා 63 දෙනෙකු ස්ථිරව බඳවාගෙන තිබුණි. | 2023 සැප්තැම්බර් 01 දින ගරු විෂයභාර අමාත්‍යවරයාගේ ප්‍රධානත්වයෙන් අමාත්‍යංශ ලේකම්වරයා පැවැත්වූ විශේෂ සාකච්ඡාවේදී අධිකාරියේ වර්තමාන කාර්යභාරයට අනුගතව ප්‍රතිව්‍යුහගත වැඩ පිළිවෙලක් ක්‍රියාත්මක කල යුතු බවත්, ඒ සඳහා අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබා ගැනීමෙන් පසු අධිකාරියේ ඉදිරි වැඩ සැලැස්ම සකස් කිරිමටත් තීරණය විය. ඒ අනුව තනතුරු පුරප්පාඩු පිරවිම තාවකාලිකව අත්හිටුවා ඇති බව දන්වමි. | ප්‍රතිව්‍යුහගත වැඩපිළිවෙලක් කඩිනමින් ක්‍රියාත්මක කර ඒ අනුව පුරප්පාඩු පිරවීමට කටයුතු කළ යුතුය. අනුමත කාර්ය මණ්ඩලයට ඇතුළත් නොවුණු තනතුරු සඳහා නිලධාරීන් බඳවා නොගත යුතුය. |

### 3.10 වාහන පද්ධතිය කළමනාකරණය

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ශ්‍රී ලංකා මහවැලි අධිකාරියට අයත් වලව නේවාසික ව්‍යාපාර කළමනාකරණ කාර්යාලයට අනුයුක්ත කර තිබුණු අංක WP-JF 3105 දරන වාහනය 2004-2005 කාලය තුළ අනුමැතියකින් තොරව බාහිර පාර්ශවයක් වෙත ලබාදී ඇති බව ඉකුත් වර්ෂවල විගණන වාර්තා මඟින් දක්වා තිබුණද 2023 ජුනි 23 දින දක්වා ඒ සම්බන්ධයෙන් කිසිදු ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි. | වලව කලාපයට අනුයුක්ත අංක WP JF – 3105 දරණ කැබ් රථය අස්ථානගත විම සම්බන්ධව මූලික විමර්ශනයක් පැවැත්විම සඳහා 2023 මැයි 02 දින පත්කරන ලද කමිටුව මඟින් ඉදිරිපත් කරන ලද නිර්දේශ සඳහා ඉදිරි ක්‍රියා මාර්ග ගැනිමට කටයුතු කරමින් පවති. | මේ සම්බන්ධව කඩිනම් ක්‍රියාමාර්ග ගෙන වාහනය නැවත ලබාගැනීමටත්, වාහනය ලබාදුන් නිලධාරීන්ට එරෙහිව විනයානුකූල ක්‍රියාමාර්ග ගැනීමටත් කටයුතු කළයුතුය. |

| | | | |
|---|---|---|---|
| (ආ) | වාරිමාර්ග දෙපාර්තමේන්තුවට අයත් වාහන 15 ක් එම දෙපාර්තමේන්තුවට විධිමත්ව භාරදීමට හෝ අධිකාරිය වෙත පවරා ගැනීමට කටයුතු නොකර අධිකාරියේ තඹුත්තේගම යාන්ත්‍රික වැඩපල භූමියේ රඳවා තබා තිබුණි. | වාරිමාර්ග අමාත්‍යාංශයට අයත් මෙම වාහන ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය වෙත පවරා දෙන ලෙස හෝ එම වාහන වාරිමාර්ග දෙපාර්තමේන්තුව වෙත රැගෙන යන ලෙස දැනුම් දී ඇතත් ඒ සඳහා ප්‍රතිචාර ලැබී නොමැත. | මෙම වාහන වාරිමාර්ග දෙපාර්තමේන්තුව වෙත පවරාදීමට හෝ අධිකාරියට පවරා ගැනීමට කටයුතු කළයුතුය. |
| (ඇ) | (i) 2019 වර්ෂයේදී වාහන අපහරණය සඳහා පත් කළ කමිටුවේ නිර්දේශය අනුව වාහන 45 ක් වාහන ලෙස බැහැර කිරීමටත්, වාහන 63 ක් අබලි යකඩ ලෙස බැහැර කිරීමටත්, වාහන 31 ක් නැවත අලුත්වැඩියා කර ප්‍රයෝජනයට ගැනීමටත් තීරණය කර තිබුණි. අබලි යකඩ ලෙස බැහැර කළ වාහන 63 ක වැසි අංක ඉවත් කර එම වැසි අංක මෝටර් රථ ප්‍රවාහන කොමසාරිස් කාර්යාලයට බාරදී තිබුණද, එම වාහනවලින් 25 ක හිමිකාරීත්වය අධිකාරිය සතුව නොතිබුණි. | කඩිනම් මහවැලි සංවර්ධන ව්‍යාපෘතිය යටතේ ක්‍රියාත්මක වූ කාල සීමාව තුළ ආනයනය කරන ලද උක්ත වාහන එම අවස්ථා වලදී ක්‍රියාත්මක කරන ලද ව්‍යාපෘති කාර්යාල නමින්ද තවත් සමහර වාහන ආධාර සපයන ලද ආයතන නමින්ද ලියාපදිංචි කර ඇත. අදාල වාහන ව්‍යාපෘතිය අවසානයේ එහි මූලිකම ආයතනය වන අධිකාරිය වෙත භාර දීමට කටයුතු කර ඇති නමුත් එහි ලියාපදිංචි අයිතිය විධිමත් අන්දමින් පවරා දීමට කටයුතු කර නොමැත. වසර 30 කට වඩා පැරණි මෙම අබලි වාහනවල අයිතිය සඳහන් ආයතන දැනට රට තුළ ක්‍රියාත්මකව නොපවතී. | වාහන අපහරණය කිරීමට ප්‍රථම ඒවායේ අයිතිය අධිකාරිය වෙත පවරා ගැනීමට කටයුතු කළයුතුය. |
| | (ii) විගණිත දින එනම් 2023 අප්‍රේල් 28 වනවිට අබලි යකඩ ලෙස ලියාපදිංචිය අවලංගු කිරීමට හඳුනාගන්නා ලද අංක 31-9908 හා 32-2129 දරන වාහන පෞද්ගලික පාර්ශවයන් විසින් භාවිතා කරනු ලබන බව මෝටර් රථ ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුවේ දත්ත පද්ධතිය පරීක්ෂාවේදී නිරීක්ෂණය විය. අබලි යකඩ ලෙස ඉවත් කිරීමට වැසි අංක ඉවත් කළ වාහන 44 ක ලියාපදිංචිය විගණිත දින වනවිටත් අවලංගු කර නොතිබුණි. | අංක 31 – 9908 හා 32- 2129 වාහන වල අයිතිය පිළිවෙලින් හයාමාතෝඩා හා හිල් ඉන්ටර්නැෂනල් යන විදේශීය ආධාර සැපයූ ආයතන සතුවේ. එහි වැසි අංක කපා ඉවත් කර මෝටර් රථ ප්‍රවාහන කාර්යාලය වෙත භාරදීමට කටයුතු කර ඇත. 2023 වර්ෂයේ අගොස්තු මස පැවති අපහරන (Disposal) ක්‍රියාවලිය යටතේ අබලි ද්‍රව්‍ය ලෙස (යකඩ බරට) අදාළ වාහන ගැනුම්කරුවන් විසින් දැනටමත් කලාපවලින් රැගෙන ගොස් ඇත. | ලියාපදිංචිය අවලංගු කළ වාහන නැවත භාවිතය පිළිබඳ විධිමත් පරීක්ෂණයක් පැවැත්වීමට වහාම පියවර ගතයුතුය. ලියාපදිංචිය අවලංගු නොකළ වාහනවල ලියාපදිංචිය අවලංගු කර අපහරණයට වහාම පියවර ගතයුතුය. |

| | | | |
|---|---|---|---|
| (ඇ) | 2022 දෙසැම්බර් 31 දිනට පිරිවැය රු.7,898,381 ක් ලෙස දක්වා තිබූ දිගන නේවාසික ව්‍යාපාර කළමනාකරණ කාර්යාලයට අනුයුක්ත කර තිබූ අංක PG-0455 දරන වාහනය 2021 මැයි 07 දින අනතුරකට ලක්ව තිබුණි. අනතුර සිදුවී වර්ෂ 02 කට අධික කාලයක් ගතවූ පසුවද වාහනයේ අලාභය තක්සේරු කර අලුත්වැඩියා කටයුතු සිදුනොකිරීම හා අදාළ වාහනයේ 2022/2023 වර්ෂයට අදාළ රක්ෂණය නිසි කලට සිදුනොකිරීම හේතුවෙන් රක්ෂණ ආයතනයෙන් ලබාගත හැකි රක්ෂණ වන්දි ලබාගැනීමටද නොහැකිවීම සම්බන්ධයෙන් ඊට වගකිවයුතු නිලධාරීන්ට එරෙහිව විනයානුකූලව කටයුතු කර නොතිබුණි.<br><br>තවද, 2023 පෙබරවාරි 14 දින ටොයෝටා ලංකා ආයතනය මඟින් දින 05 ක් සඳහා පමණක් වලංගු වන පරිදි ලබාදුන් ඇස්තමේන්තුව අනුව අලුත්වැඩියාව සඳහා වැයවන මුදල රු.3,419,252 ක් විය. එසේ වුවද විගණිත දින වූ 2023 අප්‍රේල් 28 වනවිටත් අදාළ අලුත්වැඩියාව සිදුකිරීමට අවශ්‍ය පියවර ගෙන නොතිබුණි. | නේවාසික ව්‍යාපාර කළමණාකාර ඊ් කලාපයට අයත් අංක WP/PD – 0455 කැබ් රථය 2021 මැයි 07 දින අනතුරට ලක්විම සම්බන්ධ මූලික විමර්ශනයක් පවත්වා එම නිර්දේශ පදනම් කර ගෙන කැබ් රථයේ අලුත්වැඩියා කිරිම සහ ඇස්තමේන්තු ගත මුදලින් රක්ෂාණාවරණයෙන් ආවරණය නොවන මුදල කැබ් රථයේ රියදුරු ලෙස රාජකාරි කල සේවකයාගෙන් අය කිරිමට දැනුම් දී ඇත.<br>වාහන අලුත්වැඩියාව සඳහා ඇස්තමේන්තුගත මුදල රු.3,419,152.42 ක් වන අතර රාජ්‍ය මුදල් චක්‍රලේඛ 01/2020 පරිදි ලේකම්, වාරිමාර්ග අමාත්‍යාංශය වෙත අංක MASL/ADM/DP/2337 හා 2023 අගෝස්තු 23 දිනැති ලිපිය මඟින් මේ පිළිබඳ දැනුවත් කර ඇත. | පාඩු හා හානි සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කර අදාළ වගකිව යුතු පාර්ශව වෙතින් පාඩුව අයකර ගැනීමට පියවර ගතයුතුය.<br>වාහනය නිසි කලට අලුත්වැඩියා නොකිරීම හේතුවෙන් දැරීමට සිදුවූ අමතර පිරිවැය හා රක්ෂණය නොකිරීම නිසා දැරීමට වන අලාභය ඊට වගකිවයුතු නිලධාරීන්ට එරෙහිව පරීක්ෂණ පවත්වා එම නිලධාරීන්ගෙන් අයකර, රාජකාරී නිසි පරිදි ඉටු නොකිරීම සම්බන්ධයෙන් විනයානුකූල ක්‍රියාමාර්ග ගතයුතුය. වාහනය වහාම අලුත්වැඩියා කර ධාවනයට එක්කර ගතයුතුය. |
| (ඉ) | මහවැලි කේන්ද්‍රයේ අධ්‍යක්ෂවරයා වෙත අනුයුක්ත කර තිබූ අංක CAF-1918 දරන රථය 2020 පෙබරවාරි 24 දින අනතුරකට පත්ව තිබුණද මුදල් රෙගුලාසි 104(4) අනුව මාස 03 ක් ඇතුළත ඉදිරිපත් කළ යුතු හානිය සම්බන්ධ පූර්ණ වාර්තාව විගණිත දින වූ 2023 අගෝස්තු 08 දින වනවිටත් ඉදිරිපත් කර නොතිබුණි. අනතුරට අදාළ අලුත්වැඩියාවන් සඳහා අධිකාරිය විසින් රු.932,373 ක් වැයකර තිබූ නමුත් රක්ෂණ වන්දි ලෙස ලැබී තිබුණේ රු.318,350 ක් පමණක් බැවින්, රු.614,023 ක් වූ ඉතිරි අලාභය වගකිවයුතු | අංක CF - 1918 දරණ වාහනය අනතුරකට ලක්වීම සම්බන්ධව මූලික විමර්ශනයක් සිදු කිරීමට අදාළව ප්‍රකාශ ලබා ගැනිම සඳහා පැමිණෙන ලෙස අවස්ථා දෙකකදි වෙන් වෙන් වශයෙන් එවකට මහවැලි කේන්ද්‍රයේ අධ්‍යක්‍ෂ ලෙස රාජකාරි සිදු කළ නිලධාරි මහතාට සහ කොන්ත්‍රාත් පදනමින් සේවය කරන ලද රියදුරු මහතාට දැනුම් දි තිබුණද ඒ සඳහා පැමිණ නොතිබුණි.<br>වාහනය අනතුරට ලක්විමෙන් ශ්‍රී ලංකා මහවැලි අධිකාරියට සිදු වු මුල්‍යමය අලාභයෙන් | පාඩු හා හානි සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව නොපමාව පරීක්ෂණ සිදුකර අදාළ වගකිව යුතු පාර්ශව වෙතින් පාඩු අයකර ගැනීමට පියවර ගතයුතුය. |

| | | | |
|---|---|---|---|
| | පාර්ශවයන්ගෙන් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | රක්‍ෂණාවරනයෙන් ආවරණය නොවන මුදල වන රු.1,652 ගෙවන ලෙස එකී රියදුරු මහතාට දැනුම් දි තිබුණද මේ වන තෙක් ගෙවා නොමැති බව දන්වා සිටිමි. | |
| (ඊ) | දෙහිඅත්තකන්ඩිය නේවාසික ව්‍යාපාර කළමනාකරණ කාර්යාලයට අනුයුක්ත කර, මහවැලි සංවර්ධන රාජ්‍ය අමාත්‍යවරයාගේ උපදේශකවරයකු වෙත ලබාදී තිබුණු වාහනයක් 2019 දෙසැම්බර් 22 දින අනතුරට ලක්වී තිබුණු අතර මුදල් රෙගුලාසි 104(4) ප්‍රකාරව මාස 03 ක් ඇතුළත ඉදිරිපත් කළ යුතු හානි සම්බන්ධ පූර්ණ වාර්තාව ඉදිරිපත් කර තිබුණේ 2023 මැයි 22 එනම් අනතුර සිදුවී වර්ෂ 03 කුත් මාස 05 කට පසුවය. වාහනය රු.9,991,909 ක ඇස්තමේන්තුවක් මත අලුත්වැඩියා කටයුතු සඳහා 2023 මාර්තු 23 දින නියෝජිත ආයතනයට භාරදී තිබූ අතර, රක්ෂණ වන්දි ලෙස රු.3,700,000 ක් පමණක් අනුමතවී තිබුණි. ඒ අනුව අයකර ගත නොහැකි රු.6,217,909 ක අලාභය වගකිවයුතු පාර්ශවයන්ගෙන් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | අංක WP PH – 0845 කැබ් රථය අනතුරකට පත්විම.<br>ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය වෙත සිදුව ඇති මුල්‍යමය අලාභයෙන් රක්ෂණයෙන් ආවරණය නොවන මුදල රු.6,217,909.16 ක මුදල ගෙවිම් කරන ලෙස අදාළ නිලධාරියා වෙත 2023 මැයි 29 හා 2023 ජුනි 16 දිනැති ලිපි මගින් දැනුම් දි ඇත. ගෙවිම් සම්බන්ධව මෙතෙක් පිලිතුරක් ලබා දි නොමැත. එබැවින් 2023 අගෝස්තු 07 දිනැති ලිපිය මගින් මේ සම්බන්ධව අවශ්‍ය නිතිමය ක්‍රියාමාර්ග ගැනිමට නිති අංශය මඟින් කටයුතු සිදු කරමින් පවති. | පාඩු හා හානි සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව නොපමාව පරීක්ෂණ සිදුකර අදාළ වගකිව යුතු පාර්ශව වෙතින් පාඩු අයකර ගැනීමට පියවර ගතයුතුය. |